ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අප්‍රේල් 19 වන බදාදා
3 කාණ්ඩය 20 කලාපය
මිල රු. 80 යි



## සම්පූර්ණ අන්ධභාවය රැකියාවට එකම සුදුසුකම කරගත් ගාමන්ට් එකක්

## දෙවියෝ දුන්නු ගැහැණු එක්ක ඉන්න ස්ටීරියෝ ටයිප් පිරිමින්ට පින නැති හැටි

## ගෝඨාභය කිරඹකන්ද දරුවා ළිඳේ ඔබා මරා දැමුවේ කවුද? ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න අතීතය හාරා අවුස්සයි

## අලුත් අවුරුදු ඇඳුම් ඇඳගෙන අපි පරණ වන්නම නැටුවම හරිද?

විශේෂ අතිරේකයක් නොමිලේ




තිළිණි කුමාරි

ඡායාරූප - සමන් අබේසිරිවර්ධන
ඇඳුම් නිර්මාණය - UR Bridal Dresses
හැඩගැන්වීම - අමිල ගමගේ

# කවි යාය

## පැලේ තනිවුණු අසරණී

මුරුගසං වරුසාවෙ තෙමෙමින්
සැඩ හිරුරැසින් දැවෙමින්
කප්පරක් දුන් ගින්දරට
කඳුළින් සිසිල දී
ඇමදුවේ මහපාර
නුඹ රකින්නයි මගෙ දුවේ

පුපුරා අකුණු හෙණ හඬින්
ඇදහැලෙනවිට මුරුගසං වැහි
පැලේ තනිවුණු අසරණී නුඹව
සිහිවී ඇවිලුණා හදේ ගිනිදැල්

නොබලා මා එන පෙරමග
වසලා දෙරගුළු තදකොට
ඉගිබිඟි පානා සළෙලුන් මගහැර
ඉඳපන් මගෙ දුව නොබියව
එන්නම් අම්මා හනිකට

**කාන්ති විජේසිංහ**
**පන්නිපිටිය**

## එතෙර ගිය මවගෙන්

පෙම්බර දරුවනේ එන්නට ඉසුරු සොයා
සුන්දර රටක් වෙත ඔබ මව් ඉගිළ ගියා
ගින්දර ඇවිලෙනවා හදවත ඇතිව දයා
මන්දිර උඩින් බලනෙමි මම දෙනෙත අයා

පෙම්බර දියණියනි අපමණ දුක් විඳින
කරදර තමයි මිහිපිට කාටත් සිටින
ගුරු දෙගුරුන්ගෙ සැම ඔවදන් පිළිරැගෙන
යනු මැන ඉදිරියට ඔබ එඩිතර සිතින

පොඩිදුව මගේ සිටවූ මල් පඳුරු තුළින්
ලස්සන කුසුම් පිපිලද දැන් මටත් හොරෙන්
නන්දන උයනෙ එලකටුරොඩු පඳුරු උඩින්
රන් සමනලයො ඇවිදින් නටනවද උදෙන්

මව්පිය සොයුරු නෑදෑ කිසිවෙක් නැතිව
ඉන්නේ මෙමා වැලිකතරක අද තනිව
ගුණදම් නමැති මිතු පමණයි මා සතුව
ජීවිත ගමන යන්නෙමි මම දුක් මුසුව

ලස්සන හිම වැටෙන මේ රට හරිම සරුයි
ලස්සන මල් පිපී දස අත සුවඳ හමයි
දුප්පත් අහිංසක මිනිසුන් මෙහිද වෙසෙයි
මගෙ සිරිලක් මවුනි මටනම් අගය ඔබයි

**එස්.මැණිකේ බී විදානෙ ආරච්චි**
**කඳන**

## කඳුළු ගඟේ

ගමේ පාසලෙන් සමුගෙන
සිදදියේ සිප්හල වෙත
ගමන් යද්දි බස් රථයෙන්
සුදු ගවුමත් කිළිටි වුණා
කඳුළු ගඟේ සේදුවාට
ගවුමෙන් නැත සුද ආවේ

**ලීල් චන්ද්‍රසිරි**
**නෑගම්පහ**

## විඳීම

සතුට විතරක්ම
සොයන මිනිසුනේ
එයම විතරක් නම්
ජීවිතේ...
කිමද නුඹලා
විරහ ගී අහන්නේ
දුකද හැඟුමක්ය
මනසේ...
විඳිය හැකි නම්
රිසි සේ...

**ශල්‍ය වෛද්‍ය**
**දහම් කීර්ති ජයකොඩි**
**කුරුණෑගල**
**ශික්ෂණ රෝහල**

## ඇවිත් පලයන් පුතේ!

වත්තේ වැටුණු කෙහෙල්කැන් ඉදිල තියෙනවා
අලුත ගත් වී ටිකක් හෙට උදේ කොටනවා
අඟුණකොල මැල්ලුමත් කොස් එක්ක හදනවා
කිරි හොද්ද වැව් මාළු පෙර ලෙසම ඉදෙනවා

තාත්තත් උදේ සිට වතු උදලු ගානවා
මතක් වුණ ගමන් විත් උඹ ගැනම අහනවා
ඇස් දෙකෙන් උණු කඳුළු කැට බිමට වැටෙනවා
මමත් සිල් ගන්න මුත් ඔහුට බොරු කියනවා

අද එනවා හෙට එනවා හැමදම කියනමුත්
ආව දවසක් නැනෙ වසර ගණන් ගියත්
ඇත්ත කියපන් අපට කිසිදක නොඑන මුත්
හිත හදගන්න හැකි හදේ දුක වැඩි වුණත්

අඩුපාඩු එක්ක අපි ජීවිතේ ගෙවනවා
රජ මැදුරු හදගෙන උඹ සතුටෙ රැඳෙනවා
අබමල් රේණුවක දෙසක් නොම කියනවා
ඇවිත් ගිය දිනේ අපෙ හිත් අඩුව පිරෙනවා

**සුසීමා චාන්දනී සේසත්පුර**
**නැගෙනහිර පල්ලියපිටිය, දූනගහ**

## එපා එපා

හැමදමත් බත් කන්නට
ලේන් පැටියා එනවා
බත් ඇටයක් දෑතට ගෙන
හුරතලේට කනවා
වටේට ඇස් හරව හරවා
විමසිලිමත් වෙනවා
බලා ඉන්න විට හිත තුළ
සතුට මෝදු වෙනවා

එහා ගෙදර චූටි පූසි
දුවගෙන මෙහෙ එනවා
ඤාව් ඤාව් කිය කිය මගෙ
දෙපතුල දැවටෙනවා
චූටි ලේනා දැකලා උගේ
පස්සෙන් පන්නනවා
අනේ පූසි එපා කන්න
මගෙ හද කකියනවා

**පත්මා සේනානායක**
**අඹේපුස්ස**

## සැබෑ ප්‍රේමය ළගම තිබුණත්?


රත්තරං තැවරූ මුද්දක්
රතු පාට රෝස මල් පොකුරක්
චූටි චොකලට් කැල්ලක්
වෙනුවෙන් අපි නහින තරමක්

බස් හෝල්ට් දහස් ගාණක්
ජූස් බාර් එකක නැටුමක්
කොනේ සීට් එකක මුල්ලක්
ආදරේ අපි හොයපු තරමක්

ඔන්ලයින් පන්තියක්
ඩේටා බැමි ගොන්නක්
කාලය කා දැමීමක්
අපිට නොතේරෙන තරමක්

මාස දෙක තුනක ලව් එකක්
ජීවිතේ එපා කරවන්නක්
මාපියන් අමතකම වන්නක්
ලොකුම කරුමෙකට හවුල් වන්නක්

**නවෝදා දෙව්මිණී ප්‍රනාන්දු**
**කැලණිය විශ්වවිද්‍යාලය**



**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**

''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට ඊමේල් කරන්න

ධරණී

**ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**

අංක 91, විජේරාම මාවත, කොළඹ 07. දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

ධරණී
**පුවත් පත නිවසටම ගෙන්වාගන්න අමතන්න**
**076 1367 623**

# ඒ වෙලාවේ හැමෝගෙම හදගැස්ම එකයි ඒත් නම කිව්ව ගමන් මගේ හදවත වැඩිපුර ගැහෙන්න ගත්තා



## උරේෂා සෙව්වන්දි

### දෙරණ අවුරුදු කුමරිය 2023

එක්දස් නවසිය හැට ගණන්වල ‘දවස’ පත්තරේ වැඩ කරපු ඩී.බී. ධනපාල මහත්තයා ‘දවස අවුරුදු සුන්දරී’ කියලා අලුත් තරඟයක් සංවිධානය කළාලු. අපේ රටේ පළමු අවුරුදු කුමරිය තේරීමේ තරඟය විදියට හැඳින්වෙන්නේ ඒ තරඟය. කාලෙත් එක්ක මේ තරඟය ගමින් ගමට ගිහින් අවුරුදු කුමාරි තේරීම සිංහල අවුරුද්දට නැතිවම බැරි අංගයක් වුණා. එදට ඉතින් අවුරුදු කුමරිය විදියට අභිසෙස් ලබන්නේ ගමේ රටේ ඉන්න හැඩකාරම කෙල්ල.

**‘මිණිමුතු මල් මාල දමා**
**බක් මාසේ**
**නිල්ල මැදින්**
**එබී බලනවා**
**අවුරුදු කුමරී**
**වසන්ත සමයේ**
**රූප ශ්‍රියාවී’**

අවුරුදු සමයම සුන්දර කරන රූප ශ්‍රියාවිය අවුරුදු කුමරිය කියලයි ජැක්සන් ඇන්තනී මහත්මයයි කුමාරි මුණසිංහ මහත්මියයි ගායනා කරන ඔය බක්මහේ ගීයෙන් කියැවෙන්නේ.

වසන්ත සමය හැඩකරන එහෙම රූපශ්‍රියාවියක් එක්කයි අපිත් දැන් කතා කරන්නේ හදන්නේ. ඈය 2023 වර්ෂයේ දෙරණ අවුරුදු කුමරිය. තරඟකාරියන් දහස් ගණනක් අතරින් බක්මහේ කිරුළ පැළඳූ මේ සොඳුරු හැඩකාරියගේ නම තමයි උරේෂා සෙව්වන්දි.

ඇත්තටම උරේෂා බොහොම හැඩකාර තරුණියක්. අවුරුදු කුමරියක් තෝරද්දි සලකලා බලන ඡවි, කේෂ, වයං, දන්ත, මාංස කියන පංච කල්‍යාණය අඩුවක් නැතිව ඇයට තියෙනවා. කොටින්ම කිව්වොත් උරේෂට තියෙන්නේ දෙපාරක් නෙමෙයි කීපපාරක් හැරිලා බලන්න හිතෙන සුන්දර රූපයක්.

“මම හෝමාගම. වයස විසිපහයි. අවුරුදු කුමරිය තරඟයකට අයැදුම් කරන්න ඕනේ කියලා හිතේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. පෞද්ගලික වැඩත් එක්ක ඒ වෙනුවෙන් කැපවෙන්න ලොකු වෙලාවක් තිබුණේ නැහැ. හැබැයි මේ පාර නම් මම කොහොම හරි කාලය හොයාගෙන තරඟයට අයැදුම් කළා.”

අපේ රටේ ගොඩක් මාධ්‍ය ආයතනවලින් අවුරුදු කුමරිය තරඟ පවත්වනවනේ. ඉතින් ‘දෙරණ’ නාලිකාවම ඇගේ ගමන වෙනුවෙන් තෝරගන්න හේතුවක් තිබුණද කියලා අපි ඇයගෙන් ඇහුවා.

**“ඇත්තටම ඔව්. දෙරණ නාලිකාව හරහා බිහිවෙන තරු නැත්තම් අවුරුදු කුමර කුමරියෝ ඒ ජයග්‍රහණයෙන් විතරක් නවතින්නේ නැහැ. දෙරණෙන් ලැබෙන සහාය එක්ක ඒ ගොඩක් අය ක්ෂේත්‍රය තුළ ස්ථාවර වෙනවා. දෙරණ නාලිකාවේ අවුරුදු කුමරිය තරඟයට අයැදුම් කළේ ඒකයි. අනික ඇතුළේ කට්ටිය ගොඩක් සුහදශීලී කියලත් මට දැනගන්න ලැබුණා. ඒ කතාව ඇත්ත කියලා තරඟයට ගියාපුවහම මටම තේරුණා.”**

අවුරුදු කුමරිය තරඟයේ අවසාන වටයට තේරුණු කුමරියන් දොළොස්දෙනාම අතිශය සුන්දරයි. ඉතින් ඒ අය අතරින් පළමුවැනියා වෙන්න පුළුවන් වෙයි කියලා නම් උරේෂාට හිතුණේ නැතිලු.

“අවසාන ගෑනු ළමයි දොළොස්දෙනාම ලස්සනයි. ඉතින් එතැන ලොකු තරඟයක් තිබුණා. ඕනම කෙනෙක් තරඟයකට ඉදිරිපත් වෙන්නේ ජයග්‍රහණය බලාපොරොත්තුවෙන්. අවුරුදු කුමරිය තරඟයේ ජයග්‍රහණයක් ලැබෙයි කියන විශ්වාසය තිබුණත් පළමුවැනි තැන ලැබෙයි කියලා නම් හිතුවේ නැහැ.”

**ඉතින් නොහිතුව විදියට උරේෂා අවුරුදු කුමරිය විදියට අභිසෙස් ලැබුවා කියද්දි කොහොමද දැනුණේ?**

“එවෙලේ ස්ටේජ් එකේ හිටපු හැමෝටම තිබුණේ එකම හදගැස්මක්. හැමෝගෙම හිත් හයියෙන් ගැහුණා. මගෙත් එහෙමයි. ජයග්‍රාහිකාව විදියට මගේ නම කිව්වහම ඒ ගැස්ම තවත් වැඩිවුණා සතුටට. ඒ දැනුණු සතුට කියාගන්න වචන නැහැ.”

අවුරුදු කුමරිය වෙන්න පංචකල්‍යාණය විතරක් ප්‍රමාණවත් නැහැ. ඒ සලකා බලන අනෙකුත් සාධක හදගන්න ඈ කළ කැපකිරීම් ගැන උරේෂා කිව්වේ මෙහෙම.

“ඇවිදින, කතාබහ කරන විදිය ඔය හැම එකක්ම මුල ඉඳලම පුහුණු වෙන්න වුණා. අපි හැසිරෙන විදියට අපේ පෞරුෂය පවා තරඟයේදි සලකා බැලුවා. ඉතින් මම විතරක් නෙමෙයි අවසාන ගෑනු ළමයි දොළොස්දෙනාම ඒ දේවල් හදගන්න සෑහෙන මහන්සි වුණා.”

ඈ නිතරම කතා කළේ පරාර්ථකාමී විදියට. ඒ ගුණාංගත් සමහරවිට ඇගේ ජයග්‍රහණයට හේතු වෙන්නැති. ඔය අතරේ අපි ඇගෙන් පෞද්ගලික විස්තර ගැන ඇහුවා.

**“මම නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක්. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බාහිර උපාධිය හදුරනවා. ඒ අතරේ නිරූපණය ඉගෙනගෙන නිරූපණ කටයුතුත් කරනවා.”**

ඉදිරියේදී රංගන ශිල්පිනියක් විදියට ඔබ හමුවට එන්න බලාපොරොත්තු වෙන බවත් ඇය කිව්වා.

“අම්මයි, තාත්තයි, අයියයි තමයි මගේ ගෙදර ඉන්නේ. ඒ අයත් මට ලොකු හයියක් වුණා. ඒ වගේම මතක් කරන්න ඕනේ 2012 දෙරණ අවුරුදු කුමරිය වෙච්චි රශ්මි ප්‍රභා අක්කව සහ ඇගේ සැමියා තරිත් අයියව. ඇප්ලිකේශන් එක දන තැන ඉඳලා ජයග්‍රහණය ලබනකල්ම ඒ දෙන්නා මට ලොකු සහායක් දුන්නා. ඒ වගේම අපේ අවුරුදු කුමර කුමරි ටීම් එකේ අවසාන 24 දෙනාවත් මතක් කරන්න ඕනේ. අපි හැමෝම හැමෝටම උදව් කරගත්තා. මොකක් හරි වරදක් දැක්කත් ඒක කියලා හදගන්න උදව් කරනවා. සාමාන්‍යයෙන් තරඟයක එහෙම වෙනවා අඩුයිනේ. ඇත්තටම පුහුණුවීම් කරන කාලේ තරඟයක් තියෙනවා අපිට මතක තිබුණොත් නැහැ. තව සුබෝධනී අක්කා ඇතුළු දෙරණ කාර්ය මණ්ඩලයට සහ චන්දන සර්ට ස්තූතිවන්ත වෙන්න මේක අවස්ථාවක් කරගන්නවා.”

ජයග්‍රහණය වෙනුවෙන් ඇයට අත හිත දීපු උදවිය වෙනුවෙන් උරේෂා තුති පුදකළේ එහෙම. ඉතින් 2023 දෙරණ අවුරුදු කුමරිය ලෙස අභිසෙස් ලැබූ ඇයට ‘ධරණී’ අපගේත් සුබාශිංසන!

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි





**අවුරුදු කුමරිය තරඟයට අයැදුම් කරන්න දෙරණ නාලිකාවම තෝරාගත්තේ විශේෂ හේතුවක් ඇතුවයි**



# අනේ! අම්මගෙ රෙද්ද

**අනේ පුතේ උඹට බැරිද මල්ලිත් එක්ක කතා කරලා පත්තිනි අම්මට පූජාවක් තියලා මාව පත්තිනි අම්මගේ දේව මණ්ඩලයට ගන්න කියන්න? එහෙම වුණොත් නම් මම උඹලට උදව් කරනවාමයි**



මළවුන් ගෙන්වන ශාස්ත්‍ර ඇසීම් සම්බන්ධ විස්මයජනක කතා ප්‍රවෘත්තීන් තිබේ. මේ ඉතා මෑතක මට අසන්නට ලැබුණු එවන් කතා පුවතකි.

දිවුලපිටිය ප්‍රදේශයේ ගුරුවරියකට වැඩිමල් දියණියක හා බාල පුතෙක් විය. සැමියාගේ අකල් මරණයෙන් පසු ගුරු වැටුපෙන් ඒ දරු දෙදෙනා හදවඩාගත් නමුත් ඇගේ වැඩිමල් දියණිය ඉතා අකීකරු, හිතුවක්කාර, මුරණ්ඩු තැනැත්තියක වූවාය. කුඩා කාලයේ සිට ඉතා සුළු දේට පවා දබරයට පැමිණි ඇය නව යෞවනයේදීම හිතුවක්කාර විවාහයක් සිදුකරගනිමින් එම පවුලෙන්ද වෙන් වූවාය.

එහෙත් ඇයගේ පුතණුවන් ඊට වඩා ඉඳුරාම වෙනස් ගතිගුණවලින් යුතු වූ අතර නිසි කලවයසට එළැඹි ඔහු මවගේද පූර්ණ අවසරය හා අශිර්වාදය මැද විවාහයකටද එළැඹුණි. පසුව සේවයෙන් විශ්‍රාමගත් ඒ ගුරුවරිය තම පුතණුවන් හා ලේලිය සමීපයේ ජීවත්විය. ඔවුනට දරු දෙදෙනෙකු ලැබුණු පසු එම දරුවන් සුරතල් කිරීමෙන් ද ඇය මහත් සතුටක්, ආශිර්වාදයක් ලැබුවාය. මේ අතර එම ගුරුවරියගේ වැඩිමල් දියණිය තම විවාහක සැමියා අතහැර විදේශගත වී තිබුණු අතර එහිදී හමුවූ වෙනත් පිරිමියකු හා ඇසුරට වැටී ඔහුද සමඟ මෙරටට පැමිණ වෙනම ජීවත්වන බවද ගුරුමවට දැනගන්නට ලැබිණ.

තම මවට කිසිඳු ආදරයක් කරුණාවක් නොදැක්වූ නමුදු ඇය තමන් සතු සියලුම වත්කම් තම බාල සොයුරාට සහ ඇගේ බිරිඳට හිමිකරන්නේය යන විශ්වාසයක් එම දියණිය තුළ තිබිණ. ඒ අනුව තම බාල සොයුරාගේ බිරිඳ සිය මව සමඟ පවත්වන අතිසමීප සුහදත්වයද එම වැඩිමල් දියණියගේ නොරිස්සීමට හේතුවිය. ඒ අනුව අවස්ථා කිහිපයක බලහත්කාරයෙන් තම බාල සොයුරාගේ නිවසට කඩාවැදුණු ඇය සිය මව හා දබර කරගනිමින් කියා සිටියේ නෑණාන්ඩියගේ සටකපටකම්වලට හසුනොවී මව සතු වස්තුවෙන් හරි අඩක් තමන්ටද දිය යුතු බවකි.

මේ අතර කිසියම් රෝගාබාධයකට ලක්වූ එම විශ්‍රාමික ගුරුමව හදිසියේ මියගියාය. ඉන්පසු මව සතු කුමක් හෝ ධනයක් මල්ලී සහ ඔහුගේ බිරිඳ රහසේ සඟවාගෙන ඇතැයි යන සැකය වැඩිමල් දියණියගේ සිත තුළ බුර බුරා නැගෙන්නට විය.

මළවුන් ගෙන්වා තමන්ට අවශ්‍ය කරුණ කිරි ගහට ඇන්නාක් මෙන් දැනගත හැකි අපූරු සාත්තර පොළක් ගම්පහ ආසන්නයේ ඇති බවක් ඇයට දැනගන්නට ලැබුණේ ඔය අතරේය. ඇයට වැඩිදුරටත් දැනගන්නට ලැබුණු අන්දමට එම ස්ථානයට යළි ගෙන්වාගත හැක්කේ මියගොස් තුන්මසක් ඉක්ම නොගිය මළවුන් පමණි. මරණයෙන් තුන්මසක් ඉක්ම ගිය පසු ඒ මළවුන්ගේ ආත්ම කිනම් හෝ ප්‍රතිසන්ධියක් ලබන බැවින්, ඉන්පසු මළවුන් ගෙන්වන බව කියන සියල්ලම කරන්නේ ප්‍රොඩාවන් බව ඒ ශාස්ත්‍රකාරිය තරයේ කියා සිටියාය. එමෙන්ම එම ස්ථානයේ ශාස්ත්‍ර අසන්නට යන්නවුන් ඒ මියගිය තැනැත්තා හෝ තැනැත්තිය තම ජීවිත කාලය තුළ ආශාවෙන් පරිහරණය කළ ඇඳුමක් වැනි දෙයක්ද රැගෙන යා යුතුය. එම ශාස්ත්‍ර කියන්නිය ඒ මියගිය තැනැත්තා හෝ තැනැත්තිය යළි මෙලොවට කැඳවනුයේ ඒ ඇඳුම නිමිත්ත කර ගනිමිනි.

මියගිය මව තමන්ට නොදී මල්ලීට සහ ඔහුගේ බිරිඳ වෙනුවෙන් ඉතිරිකොට ගිය වස්තු ප්‍රමාණය කොතෙක්දැයි ඇය නැවත ගෙන්වා අසා දැන, ඒවායින් කොටසක් අත්පත් කරගැනීමේ තෘෂ්ණාවෙන් පෙළුණද ඒ සඳහා අවශ්‍ය නිමිත්තක් ඇය සමීපයේ නොතිබිණ. එබැවින් තම සැබෑ සිතැඟි මුළුමනින් යටපත් කරගත් ඇය දිනක් තම බාල සොයුරා නිවසේ නොමැති අවස්ථාවක් බලා එහි ගොස් තම නෑණාන්ඩිය හමුවූවාය.

"අනේ නංගි, අපේ අම්මා ඉන්න කාලේ බොහොම ආසාවෙන් ඇඳපු රෙද්දක් මෙහේ තියෙනවා නේද? අම්මා ඊයේ රෑ මට හීනෙන් පෙනිලා කිව්වනේ ඒ රෙද්ද කාටහරි නැති බැරි කෙනෙකුට දීලා පින් අනුමෝදන් කරන්න කියලා. ඊටපස්සේ මට ඒක කරනකම් ඉවසුමක් නෑ නංගි. ඒකයි මම මේ තකහනියක් දුවගෙන ආවේ." ගුරුවරියගේ වැඩිමල් දියණිය තම නෑණාන්ඩිය හමුවේ එවැනි පට්ට කෙබරයක් ඇද බෑවාය. ඒ අනුව හනික නිවස තුළට ගිය නෑණාන්ඩිය එක් බතික් රෙද්දක් ගෙන තම සැමියාගේ සොයුරිය අත තැබුවේ ඇගේ මේ පින්කමට දයකවීමට ලැබීම ගැන සතුටු වෙමිනි.

"අනේ පුතේ උඹට මාව මතක් වුණා එහෙනම්" දේව රූපය ඉදිරියේ වූ පූජාසනය මත එම රෙද්ද තබා ඊට සුවඳ දුම් ඇල්ලූ ශාස්ත්‍රකාරිය එය මතට අත තැබූ එක් ක්ෂණයක් තුළ ආරූඪයෙන් කීවාය. තම මවගේ ස්වරයට වඩා බෙහෙවින් මළානික හැඬුම්බර බවක් ගැබ්වූ ශාස්ත්‍රකාරියගේ ස්වරයෙන් පැවසුණේ ජීවත්ව සිටි කාලයේ තමන් තුළ වූ තරහ මරහ සියල්ල මේ වනවිට පහවගොස් ඇති බැවින් අපේක්ෂා කරන ඕනෑම උපකාරයක් කිරීමට තමන් සැදී පැහැදී සිටින බවකි.


"අම්මේ, අම්මගේ ගොඩක් සල්ලි එහෙම තියෙන්නේ මල්ලි ළඟ නේද? බැරිද මටත් ඒකෙන් කොටසක් ඉල්ලගන්න?" එම දියණිය එලොව සිට පැමිණ තමන් ඉදිරියේ කටහඬ අවදි කරන සිය මවගෙන් අසා සිටියාය.

"අනේ නෑ පුතේ උඹ එහෙම හිතාගෙන හිටියට ඒ කොල්ලා ළඟ එහෙමට සල්ලියක් නෑ. අනික උන්ට මං හින්ද කොච්චර වියදම් වෙලා තියෙනවද? ඒත් පුතේ මම දැන් ඉන්න තත්ත්වේ නම් හොඳම නෑ. කොටින්ම මට දැන් ප්‍රේත ලෝකෙට යන්න වෙයි වගේ. අනේ පුතේ උඹට බැරිද මල්ලිත් එක්ක කතා කරලා පත්තිනි අම්මට පූජාවක් තියලා මාව පත්තිනි අම්මගේ දේව මණ්ඩලයට ගන්න කියන්න? එහෙම වුණොත් නම් මම උඹලට උදව් කරනවාමයි."

මියගිය මව තමන් හමුවේ එලෙස හඬා වැළපෙනු එම දියණියට ඇසුණි. එමෙන්ම ආරූඪයෙන් පසු ඒ ශාස්ත්‍රකාරියගේ සහායකයා කී අන්දමට එවන් පත්තිනි පූජාවක් කිරීම පිණිස පූජා භාණ්ඩවලට රුපියල් ලක්ෂ හතරක් පමණ වැයවෙයි. එම මුදල ඒ දේවාලයට භාරදුන් පසු ඒ පූජාව තබා ඔවුනට ඒ මියගිය මවගේ පිහිටාරක්ෂාව උපරිම ලෙස ලබාදීමට පුළුවන.

ඒ අනුව එම මුදලද කෙසේ හෝ මල්ලීගෙන් වියදම් කරවා මියගිය මවගෙන් ලැබෙන ඒ දිව්‍යමය ප්‍රතිලාභ හිමිකරගැනීමට සිතූ දියණිය මල්ලීගේ නිවෙස වෙත ගියේ ඒ සඳහා කෙසේ හෝ ඔවුන් පොළඹවා ගැනීම පිණිසය.

"අනේ අක්කේ එදා මට ලොකු වැරදීමක් වුණානේ." ඇය දුටු සැණින් බාල සොයුරාගේ බිරිඳ බැගෑපත් ලෙස කීවාය. "එදා මම අම්මගේ රෙද්දක් කියලා දීලා තියෙන්නේ වෙන එකක්. අනේ මට බනින්න නම් එපා. මම අන්න අම්මගේ ඇඳුම් ඔක්කොම් වෙන් කරලා තියාගත්තා අක්කට දෙන්න." නෑණාන්ඩිය එසේ කී සැනින් ඒ ගුරුමවගේ වැඩිමල් දියණියට ඇතිවූ හැඟීම කුමක් විය හැකිදැයි මට නම් සිතාගන්නටවත් නොපුළුවන.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

දැන්වීමකි



# ඔස්ටියෝපති ප්‍රතිකාර වලට ඔබ තවමත් යොමුවුණේ නැද්ද?

සමාජය තුළ බහුලවම දැකගත හැකි රෝගාබාධ අතරින් කොඳුඇට පෙළ ආශ්‍රිතව ඇතිවන බොහෝ රෝග සහ ස්නායු රෝග විශේෂ වේ.එම රෝග සඳහා ශල්‍යකර්මයක් හෝ කිසිදු ඖෂධයක් නොමැතිව ප්‍රතිකාර කිරීම ඔබට ආගන්තුක කරුණක් වියහැක. එහෙත් ඔස්ටියෝපති සහ හීලින්පති යන වෛද්‍ය ක්‍රමයට අනුවනම් මේ කරුණ ඉතා ප්‍රායෝගිකවම අත්විඳිය හැක. බටහිර රටවල ඉතා ප්‍රචලිත ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමයට තවත් වෛද්‍ය ක්‍රම කිහිපයක සංකලනයකින් ඔස්ටියෝපති සහ හීලින්පති වෛද්‍ය ක්‍රමය ලොවටබිහිවී ඇත. එහි ගෞරවය හිමිවන්නේද ශ්‍රී ලාංකික වෛද්‍යවරයෙකුටය. මේවන විටත් දහස් ගණනක් රෝගීන් සුවපත් වී ඇති අතර එවැනිම කොටසක් සුවය ලබමින් සිටිති. රෝග රැසක් සුවකල හැකි මෙම ඔස්ටියෝපති සහ හීලින්පති වෛද්‍ය ක්‍රමය රෝගීන්ගේ රෝග සුව කිරීමට පමණක් සීමා නොවී රෝගීන් එදිනෙදා සිදුකරන වත්පිළිවෙත් වලට මනා පිටිවහලක් වීමට හොඳ අධ්‍යාපනයක්ද ලබාදී පූර්ණ සුවය ජීවිත කාලයටම පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ද ලබාදෙයි.


වර්තමානයේ බොහෝ පාසැල් ළමුන් තුල පැතිකුදය නමැති රෝගය ශීඝ්‍රයෙන් පැතිර යනනවා.ඊට ප්‍රධාන හේතුව අධික බරක් සහිත පාසැල් පොත් බෑගයක් කරේ එල්ලාගෙන යාම සහ අමතර පන්තිවලට ගොස්, බංකු මත වැඩි කාලයක් වාඩිවී සිටීමයි. ඊට අමතරව බොහෝ දෙනා ගණුලබන ආහාරපාන නිසා තරබාරු බවටපත්ව සිටිනවා. ඉන් ඔවුන් ඉතා පහසුවෙන්ම දණහිස ආශ්‍රිත රෝග වලට ගොදුරුවී සිටිනවා. නිවැරදි ඉරියව් වල හිඳිමින් රාජකාරී කටයුතු නොකිරීම , ගෙදර දොරේ කටයුතු නොකිරීම, ව්‍යායාමවල නොයෙදීම ආදිය නිසා මේවනවිට බොහෝ පිරිසක් සන්දිගත රෝගාබාධවලින් පීඩා විඳිති. මෙවැනි රෝගීන්ට සැත්කම්වලින් තොරව ඉක්මනින් ප්‍රතිකාර කල හැකි මෙම ඔස්ටියෝපති සහ හීලින්පති ප්‍රතිකාර ක්‍රමය සාර්ථක ප්‍රතිඵල ලබාදී ඇති බව සුව වූ රෝගීන්ගේ ප්‍රකාශවලින් ඉතා පැහැදිලි වී ඇත.




පැතිකුදය




කොඳුඇටපෙළ ආබාධ





ස්නායු සහ කොඳුඇටපෙළ රෝග




දනහිස් අමාරු





සයිටිකා



නේවාසික පහසුකම



ඉරුවාරදය




ස්නායු තෙරපිම


## පූජ්‍ය පක්ෂය සහ සුවය ලැබූවන්ගේ අදහස් කිහිපයක්

### ශ්‍රී සම අනුරාධපුර ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ විහාරාධිපති සත්‍ය සුමනසිරි හාමුදුරුවෝ



මම අනුරාධපුර ශ්‍රී සම අනුරාධපුර ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ විහාරාධිපති සත්‍ය සුමනසිරි හාමුදුරුවෝ. මට වසර කිහිපයක සිටම විවිධාකාර රෝග තිබුණා . විශේෂයෙන්ම කොඳුඇටපෙළ සම්බන්ධව ඒ වගේම ස්නායු සම්බන්ධව රොග වලිනුත් පෙළෙමින් සිටියෙ. විවිධාකාර ප්‍රතිකාර ලබාගත්ත. නමුත් හරි ආකාර ප්‍රතිඵලයක් ලැබුණෙ නැහැ. මට පසුව මාලබේ අතුරුගිරිය පාරෙ පිහිටි ඔස්ටියෝපති ක්ලිනික් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධිපතිතුමා මහාචාර්ය සාගර කරුණාතිලක මැතිතුමා ඉතාමත්ම කරුණාවෙන් යුක්තව දින හතක් පමණ නේවාසිකව මට ප්‍රතිකාර කලා. එතුමාගෙ ප්‍රතිකාර ක්‍රමය ඉතාමත්ම සාර්ථකයි. අපි ශරීරයේ ඇතිවන විවිධ රෝගාබාධයන්ට විවිධ ප්‍රතිකාර ගන්නවා.විවිධ පෙතිවර්ග අරගෙන අමතර රෝග හදාගන්නව. නමුත් මෙම ස්ථානයට පැමිණිලා මහාචාර්ය තුමාගෙන් ප්‍රතිකාර කරගන්න පුළුවන් නම් කිසිම බෙහෙතක් බොන්නෙ නැතිව වෛද්‍යතුමා ගේ ප්‍රතිකාර ක්‍රමයන් උපයෝගී කරගෙන අපේ ශරීරයේ ඇති විවිධ රෝගාබාධ යන්ට ප්‍රතිකාර ලබාගෙන රෝග සුවකර ගැනීමට ඉතාම පහසු ක්‍රමයක් සහ ස්ථානයක් තමයි ඔස්ටියෝපති රෝහල. එමනිසා මම ශ්‍රී ලංකාවාසී ඔබ සියළුම දෙනාට ඉතා කිරුණිකව ඉල්ලා සිටිනවා රෝගාබාධයන්ට විවිධ තැන්වලට යමින් මුදල් වැයකරමින් කාලය නාස්ති කරමින් මේ කරන ක්‍රියා තාවකාලිකව නතර කරමින් තමන්ගේ රෝගාබාධ වට මෙම ස්ථානය පැමිණ බලන්න. අපේ මහාචාර්ය තුමා ඉතාමත්ම කරුණාවෙන් ඉතා කෙටි කාලයක් තුල එතුමාගෙ අතින්ම ප්‍රතිකාර කරල දහස් ගණනක් රෝගීන් සුවකර තිබෙනවා. ඔබටත් එම දහස් ගණනක්වු පිරිසට එක්වීමට නම් මෙම ස්ථානයට පැමිණිලා මා සුවපත් වූ අයුරින්ම ඔබත් රෝග සුව කරගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

### ශ්‍රී ධර්මාරාම සීල මහාශ්‍රමයේ වල්ලාවිල සුමනමාලා මෙහෙණින් වහන්සේ



මම කිරිවත්තුඩුවේ ශ්‍රී ධර්මාරාම සීල මහාශ්‍රමයේ වල්ලාවිල සුමනමාලා මෙහෙණින් වහන්සේ. මට කලක සිට දරුණු තුනටියේ වේදනාවක් හැදිලා තිබුණා. බිම වාඩි වුණොත් නැගිටීමට පවා ලොකු අමාරුවක් මට තිබුණා. මම මේ නිසා නොයෙකුත් තැන්වලින් එක එක ප්‍රතිකාර කළා. නමුත් මට කිසිදු සුවයක් ලැබුණේ නැහැ.

ඉන්පසුව මට දැනගන්නට ලැබුණා මාලබේ පිහිටි ඔස්ටියොපති වෛද්‍ය මධ්‍යස්ථානය සහ එම මහාචාර්යතුමා ගැන. මම එතුමා සොයාගෙන ඇවිත් මගේ රෝගී තත්ත්වය එතුමාට පැවසුවා. එතුමා මාව පරීක්ෂා කරලා බලලා මට ප්‍රතිකාර සඳහා සතියකට දවසක් පැමිණීමට යෝජනා කළා. මම දැනට වාර 4ක් පමණ එතුමාගෙන් ප්‍රතිකාර ගත්තා. මට දැන් තුනටියේ වේදනාව සම්පූර්ණයෙන්ම සුවයි. ඇත්තටම කියනවා නම් මහාචාර්යතුමාට මේ පින් බලයෙන් නිදුක් නිරෝගී සුවපත් භාවය ලැබේවා! මෙතෙක් පටන් නිවන් දක්නා ජාති දක්වා කිසියම් කාලයකවත් නිරය ආදී සතර අපායක උත්පත්තියක් ලබන්න එපා. ධනාදි පාරමිතා ධර්මයන් සම්පූර්ණ කරගෙන ධර්මඥානය, ධර්මාවබෝධය ලබාගැනීමෙන් ආයුශ් වර්ණ සැප බල ප්‍රඥා කියන ඉෂ්ට සිද්ධ වීමෙන් ජාතියක් ජරාවක් මරණයක් නැත්තා වූ සදාකාලික අතිඋතුම් අමා මහා නිවන් සුවයෙන් සැනසීමට මෙම පින් හේතු වාසනා වේවා කියලා මම ආශිර්වාද කරනවා!

### සුවය ලැබූ කාන්තාවකගේ අදහස්



මම ඉතා සතුටින් ඉන්නව. මම පත්තරෙන් දැකල තමයි මෙම ස්ථානයට ආවෙ. වෛද්‍යතුමා මට උපදෙස් දුන්න විදියට මම මෙහෙ ආව. වෛද්‍යතුමාට ගොඩක් පින්. මම ගොඩක් අමාරුවෙන් මම ආවෙ මට දැන් හොඳයි. මෙතන ඉන්න අයගෙන් ලැබුණු සහයත් ඒ වගේමයි. මෙතන ඉන්න සේවක සේවිකාවො හරිම හොඳයි. මට කියන්න වෙන කිසිම දෙයක් නැහැ.මම දන්න හැමෝටම මම මෙතනට ආ විත්තිය කියනව. මම මෙතනින් ගත්ත අත් පත්‍රිකා හැමෝටම දෙනව. වෛද්‍යතුමා ඇතුළු හැමෝම ඉතාම හොඳයි. ඉතිං අපි වගේ අයව මෙම ස්ථානයට ගෙනැවිත් ප්‍රතිකාර කරනවට ඒ අයට ගොඩක් පින්. අද මම සතුටින් ඉන්නෙ වෛද්‍යතුමා නිසයි.

## ප්‍රතිකාර ලබාගත හැකි රෝග

**Some of the diseases which are being treated.**

- කොඳු ඇට පෙළ සම්බන්ධ සියලු රෝග / Back Pain
- හිසේ රෝග Migraine
- හන්දි වේදනා / Neck Pain / Arthritis/ Shoulder Pain
- අස්ථි රෝග / Bone Disorders
- හිරිවැටීම් / Numbness
- සඳ මිදුලු හා කශේරුකා වෙන්ස්වීම් / Vertebrae & disc Misalignments
- අස්ථි තදවීම් / Bone Tightness
- ස්නායු තෙරපීම් / Spinal Nervous Decompression
- මානසික ආතතිය / Stress
- Parkinson රෝගය / Parkinson's Disease
- පැතිකුදය / Scoliosis
- අංශභාගය / Paralysis
- ස්නායු රෝග / Nervous Disorders
- විඩාබර බව / තෙහෙට්ටුව / Fatigue
- නින්ද නොයාම / Sleeplessness
- විශාදය / Depression
- රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝග All Circulatory Disorders
- මාංශපේශී තදවීම් Tight Muscles
- මධ්‍ය ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝග All Central Nervous System Related Problems

ඔබ ප්‍රතිකාර සදහා මාලබේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන්නේ නම් බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා දිනයන්හි උදේ 8:00 සිට සවස 2:00 දක්වාත්, මාතර කඹුරුගමුව ශාඛාවට පැමිණෙන්නේ නම් සදුදා උදේ 8:00 සිට සවස 2:00 දක්වාත් පැමිණිය යුතුවේ. වැඩි විස්තර සදහා www.osteodr.com වන අපේ වෙබ් අඩවියට පිවිසෙන්න.

**ඔස්ටියෝ ක්ලිනික් වෛද්‍ය මධ්‍යස්ථානය, මාලඹේ.**

531/ 1, අතුරුගිරිය පාර, මාලඹේ. ක්ෂණික ඇමතුම් 076 73 33 971 / 077 52 60 401

දු: ඇමතුම් 0112 054 444 / 0112 054 433 / 0112 054 499

**ශාඛා : කඹුරුගමුව, මාතර**

වැඩි විස්තර සඳහා www.osteodr.com වන අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

# දෙවියෝ දුන්නු ගෑනු එක්ක ඉන්න ස්ටීරියෝ ටයිප් පිරිමින්ට පින නෑ



අංජලී බුදවත්ත ජයවර්ධන
මනෝඋපදේශිකා/මාධ්‍යවේදිනී

මේ කියන කාන්තාව මගේ ළඟම හිතවතියක්. ඇය ඇගේ පවුලේ එකම දරුවා. පුංචි කාලේ ඉඳලා සැපපහසුවට හැදුනු කාන්තාවක්. ඉගෙනගෙන ඉවරවෙලා විවාහ වුණා. දරුවො දෙන්නෙක් හැදුවා. කාලෙකට පස්සේ හදිසි අනතුරකින් ඇගේ සැමියා ඔත්පල වුණා. අනතුර වෙද්දි ඇගේ දරුවන් බොහොම පුංචියි.

සැමියා ඔත්පල වුණායින් පස්සේ මේ පවුල කඩාවැටෙයි කියලා ඇගේ දෙමව්පියන් සංතාප වුණා මට මතකයි. හැබැයි එහෙම නෙමෙයි වුණේ. මගේ හිතවතිය පවුලේ බර තනියම කරට ගත්තා. පිටතින්, බැලූ බැල්මට සුකුමාල වුණත් පිරිමි කරන බර වැඩ පවා කරලා පවුල වෙනුවෙන් සල්ලි හම්බ කළා. සැමියගේ වැඩවලටවත් කාගෙන්වත් උදව් ගත්තේ නැහැ. වෛද්‍යවරු ඇඳෙන් නැගිටින්න බැරිවෙයි කියාපු සැමියට ඇගේ කැපවීම නිසාම ආයෙත් ඇවිදින්න පුළුවන් වුණා.

සමහර ගෑනු ඉන්නවා පිටතට පේන්නෙ හරි සුකුමාල ලාලිත්‍යයක් තියෙන නාරි දේහයක්. කතාබහෙනුත් එහෙමයි. හැබැයි මතුපිටින් ගැහැනියක් වුණාට ආකල්පමය වශයෙන් සහ චින්තන පද්ධතියෙන් මේ අය ගොඩක් දුරට පිරිමින්ට සමානයි. මේ කියන්නේ බාහිර පෙනුමෙන් වගේම ඇතුළාන්තයෙනුත් පිරිමින්ට සමාන ගෑහැනු ගැන නෙමෙයි. බාහිරින්, කතාබහෙන් ගෑනු වුණාට පිරිමියෙක් වගේ ඇතුළ හයිය ගෑනු ගැන. කලින් මම කියපු කාන්තාවත් අන්න එහෙම අයෙක්.

මේක සාමාන්‍ය කාන්තා පෞරුෂයෙන් ඔබ්බට මම දැකපු විශේෂ පෞරුෂයක්. මෙහෙම කන්තාවන්ව මම නම් හඳුන්වන්නේ දෙවියන් දයාද කළ ගැහැනුන් විදියට. මේ ලිපියෙන් මම කතා කරන්නේ අන්න එහෙම ගෑනු ගැන.

### කොහොමද මේ අයව අඳුනගන්නේ?

බැලූබැල්මට ඇය සාමාන්‍ය ගැහැනියක්. හැබැයි වැඩක් කරන්න ගියාපුවාහම සාමාන්‍ය ගැහැනියට වඩා වේගවත්. ගෑනු වැඩ පිරිමි වැඩ කියලා අපේ සමාජය වැඩ බෙදාගෙන ඉන්නවනේ. මේ කියන ඇයට ගැහැනු වැඩ, පිරිමි වැඩ බේදයක් නැහැ. ඒ හැම වැඩක්ම ඔවුන්ට තවත් එක මනුෂ්‍ය වැඩක් විතරයි.

මෙහෙම අය කා මතවත් යැපෙන්නේ නැහැ. බර මුට්ටයක් උස්සන්න, ගසක උසම අත්තේ තියෙන අඹ ගෙඩිය කඩාගන්න, නැත්නම් වාහනේ රෝද මාරු කරන්න මේ අයට පිරිමි හයිය ඕන වෙන්නේ නැහැ. කොහොමහරි මේක තනියම කරනවා කියන හයිය මේ අයගේ හිතේ තියෙනවා. ඇඟේ හයිය නැතත් හිතේ හයිය නිසාම ඒ වැඩේ කරන්න එතකොට ඔවුන්ට පුළුවන්.

ඕනම කට්ටක් කාලා අනිත් හැමෝවමත් ගොඩදාගෙන තමනුත් ගොඩයන්න බලන නිසා සමාජයේ හැමතැනකදීම මේ අයව කැපිලා පේනවා. දේශපාලනයෙන්, කලාවෙන්, වෘත්තිමය පැත්තෙන් ඔය ඕන පැත්තකින් හිනිපෙත්තටම යන්න මෙහෙම ගෑනුන්ට පුළුවන්. අපේ රටේ සාර්ථක වෙච්චි ප්‍රසිද්ධ කාන්තාවන් බහුතරයකට මේ කියන පෞරුෂය තියෙනවා.

මෙච්චර වෙලා කතා කළේ මේ වගේ පෞරුෂයක සුබවාදී පැත්ත. හැබැයි මෙහෙම අයට මුහුණ දෙන්න වෙන නරක පැත්තකුත් තියෙනවා.

බහුතරයක් පිරිමි මුලදි ආකර්ෂණය වෙන්නේ කාන්තාවකගේ මතුපිට ස්වරූපයට. බුද්ධිමත් හැසිරීමට (Smartness). මේ කියන කුලකයේ කාන්තාවන් තුළ ඒ ලක්ෂණ උපරිමයි. හැබැයි ආශ්‍රය කරද්දි මේ පෞරුෂයේ සෘජුබව දරාගන්න පිරිමින්ට අමාරු වෙනවා. ඒක වෙන්නේ මෙහෙමයි. පවුලක් ඇතුලේ ගැහැනියට වඩා පිරිමියා කැපී පෙනෙන්න ඕනය කියලා සාම්ප්‍රදායික නැත්නම් ස්ටීරියෝ ටයිප් පිරිමියා හිතනවා. හැබැයි අර පෞරුෂ ලක්ෂණ එක්ක කැපිලා පේන්නේ කාන්තාව. අනිත් අය එක්ක ගනුදෙනු කරද්දි ඇය ඉදිරියෙන් ඉන්නවා. පුංචි කාලෙදි මොන දේ ඇහුවත් අම්මගෙන් අහලා කියන්නම් කියනවා වගේ කොයිදේත් හස්බන්ඩ්ගෙන් අහලා කියන්නම් කියන කාන්තාවන් ඉන්නවනේ. හැබැයි සැමියාගෙන් අහලා තීරණ ගන්න ඕන කියලා අර පෞරුෂය සහිත කාන්තාවන් කිසිම වෙලාවක හිතන්නෙ නැහැ. උදාහරණයක් විදියට පිරිමි විතරක් වැඩ කරන තැනක ඇයට හොඳ රැකියාවක් ලැබෙනවා. දෙපාරක් නොහිතා සැමියාගෙනුත් නාහා ඇය ඒ අවස්ථාව බාරගන්නවා. ඒක ඇගේ පණ්ඩිතකම නෙමෙයි. ඈට තියෙන උනන්දුව, උවමනාව, ධාරිතාවය මත ඇයට ඒ වගේ තීරණයක් තනියම ගන්න පුළුවන්. ඔන්න එතකොට තමයි ගැටුම පටන්ගන්නේ.

> ඒ වෙනස දරාගන්න බොහොම ආදරණීය පිරිමිත් ඉන්නවා. හැබැයි එහෙම පිරිමියෙක් දැක්කහම ආයෙත් අර සාම්ප්‍රදායික සනුහරේ අර මනුස්සයගෙ පිරිමිකම ගැන ප්‍රශ්න කරනවා

අර කලින් කිව්වා වගේ ගොඩක් පිරිමි හොයන්නේ අවනත ගෑනු. ඉතින් ගැහැනිය පිරිමියා අභිබවා යද්දි ඒක පිරිමින්ට රුස්සන්නේ නැහැ. ඒ විතරක්ද ඒක අවට සමාජෙට රුස්සන්නෙත් නැහැ. පස්සෙ මේ කාන්තාව එක්ක ජීවත්වෙන්න පිරිමි අදිමදි කරනවා. පිරිමියා විතරක් නෙමෙයි අවට සමාජයත් ඇයට ගල් ගහනවා. පණ්ඩිත ගෑනු, හිතුවක්කාර ගෑනු, රැඩිකල් වෙන්න දඟලන ගෑනු කියලා ලේබල් ගහනවා. පියාඹන එක ලෙඩක් කියලා කූඩුවේ ඉන්න කුරුල්ලෝ හිතනවා කියනවා වගේ පිරිමින්ට විතරක් නෙමෙයි බහුතරයක් ගෑනුන්ටත් මේ පෞරුෂය සහිත කාන්තාවන්ගේ කල්ක්‍රියාව දිරවන්නේ නැහැ.

හැබැයි ඒ වෙනස දරාගන්න බොහොම ආදරණීය පිරිමිත් ඉන්නවා. අර වගේ ගැහැනියක් දිහා ආදරණීයව, විවෘතව බොහොම ඉවසීමෙන් බලන්න ඒ අයට පුළුවන්. තමන්ගේ ගැහැනියගේ දියුණුව සාර්ථකත්වය දැකලා පහතට හෙළන්න බලන උදවිය අතරේ මේ අය තමන්ගේ සහකාරියට අත්පොඩි තලනවා. තමන්ගේ සහකාරිය තමාව ඉක්මවලා යන දිහා බලලා සතුටුවෙන පිරිමියෙක් දැක්කහම ආයෙත් අර සාම්ප්‍රදායික සනුහරේ අර මනුස්සයගෙ පිරිමිකම ගැන ප්‍රශ්න කරනවා. හැබැයි මම දකින විදියට නියම පිරිමිකම ඒක. අවාසනාවට එහෙම පිරිමි පරාණ අතිශයින් දුර්ලභයි. හැබැයි වාසනාවකටවත් අර පෞරුෂය සහිත කාන්තාවකට මෙහෙම ආදරණීය මිනිහෙක් මුණගැහුනොතින් ඒ දෙන්නට සාර්ථකත්වයේ අසීමාන්තික දුරක් යන්න පුළුවන්.



මේ ජාතියේ කාන්තාවන්ට තව ප්‍රශ්නයක් එනවා. මේ අය බැඳීම්වලට හරි කෑදරයි. අසීමිතව ආදරය කරනවා. බොක්කෙන්ම ලව් කරනවා කියලා කතාවට කියන්නේ. ආදරය කරන කෙනා වෙනුවෙන් ඕනම දෙයක් කරන්න මේ අය ලැහැස්තියි. ඒ වගේම ඔහුට තමන්ගෙන් වෙන්න ඕන යුතුකම් ගැන හරියටවත් හිතනවා. හැබැයි පෞරුෂයේ සෘජුබව නිසා මේ අය එක්ක ඉන්න පිරිමි අදිමදි කරනවා කිව්වනේ. ඒ වගේ තැනකදී සම්බන්ධය නැවතුණොත් මේ අය ඇතුළාන්තයෙන්ම කඩාගෙන වැටෙනවා. රෑ දවල් අසීමිතව කඳුළු හලනවා. විරහා වේදනාව නිසා උපදේශනයට එන කාන්තාවන් අතරෙත් මෙහෙම අය මුණගැහෙනවා. හැබැයි එහෙමයි කියලා මේ කාන්තාව එතැනින් නතර වෙන්නෙ නැහැ. කාලයත් එක්ක ශක්තිමත් වෙනවා. වැටෙන්න වැටෙන්න මුවහත් වෙනවා. අඩියක් පස්සට යන්නේ අඩි දෙකක් ඉස්සරහට එන්න කියන්නා වාගේ වැටුණු තැනින් ඇය අඩි කිහිපයක්ම ඉදිරියට යනවා. නියම නැවියෝ බිහිවෙන්නේ කුණාටු මුහුදෙදිනේ. අන්න ඒ වගේ අභිමිවීම්, ප්‍රශ්න එන තරමට ඇය ශක්තිමත් වෙනවා.


මේ අය ඉතාම සුන්දරයි, ආකර්ෂණීයයි. මේ ලිපිය කියවලා ඔබත් ඒ විදියේ ගැහැනියක්ද කියලා ඔබම තීරණය කරන්න. එහෙම කෙනෙක් නම් දෙන්න උපදෙසක් තියෙනවා. මේ අය ආදරේ වෙනුවෙන් ඕනම දෙයක් කරන අය. ඉතින් ආදරේ නාමයෙන් කෙනෙක්ට පහසුවෙන්ම යම් යම් දේට ඔබව පාවිච්චි කරන්න ලේසියි. සමහරු මේ වගේ අයට වගකීම් කර ඇරලා අත පිහිදගන්නවා. ඉතින් ඔබට ඇත්තටම ආදරේ කරන්නේ, ළඟින් ඉන්නේ කවුද කියන එක තේරුම්ගන්න. මිනිස්සු ගැන අවබෝධයෙන් ඉන්න.

ගෑනු ඇඟක් එක්ක හයිය හිතක් තියෙන මෙහෙම කාන්තාවක් හමුවුණොතින් ඇය එක්ක ආදරෙන් අවබෝධයෙන් ඉන්න. ඔබ ආදරේ කරන්නේ එහෙම ගැහැනියකට නම් ඇගේ ආදරය රැකගන්න. දවසක ඇය ඔබව අහසේ වුණත් ඔසවා තියාවි.

ඒ වගේම අනිත් ගැහැනුන්ටත් කියන්න දෙයක් තියෙනවා. කාගෙවත් හෙවනකට ඕනවට වඩා මුවාවෙන්න එපා. එතකොට හෙවන නැතිවුණ දක තට්ට තනියම අව්ව දරාගන්න අමාරුයි. ගැහැනුකම කියන්නේ පිරිමියෙක් මත යැපිලා ගෙදර වැඩවලටම දියාරු වෙලා ළමයි හදලා මැරිලා යන එකට නෙමේ. කාන්තාවක් විදියට ඔබටම ආවේණික ජීවිතයක් හොයාගන්න බලන්න. පුළුවන්නම් අපි කතා කරපු තාලේ ගැහැනියක් වෙන්න උත්සාහ කරලා බලන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# හිත රිද්දන එක උන්ගෙ විදිය වුණාම ඉවසන එක අපේ විදිය වෙන්න ඕනැද?



කල්පනා මේසයට හිස ඔබාගෙන ඉකිබිඳිමින් සිටින්නීය. ඒ ඇයිද කියා මම හොඳින්ම දන්නෙමි. ඒ සරලා මැඩම්ගේ බැණුම් නිසාය. සරලා මැඩම්ව මට මෙන්ම කාර්යාලයේ කිසිවෙකුට පෙනෙන්නට බැරිය. ඇය ඉතා කුඩුකේඩු චරිතයකි. ඇය සිත නොරිදවූ පුද්ගලයකු කාර්යාලයේ නැතිතරම්ය. අනුන්ගේ අඩුපාඩු සොයන්නට, නැති වැරදි මවන්නට, අනුන් ගැන කේලම් අලුතෙන් නිර්මාණය කරමින් තැන තැන පවසන්නට සරලා මැඩම්ට ඇත්තේ අපූරු හැකියාවකි. තනතුරෙන් ඇය ඉහළ නිසා අප සැවොම ඒවා ඉවසාගෙන සිටින්නෙමු.

සරලා මැඩම්ගේ අලුත්ම ගොදුරු කල්පනාය. කුමක් හෝ හේතුවකට ඇයට කල්පනාව පෙනෙන්නට බැරිය. කල්පනාගේ වැරදි සෙවීම ඇයගේ විනෝදාංශය වැනිය. කල්පනා කුමන වැඩක් කළද එහි අඩුපාඩුවක් සොයාගෙන දරුණු ලෙස බැණ වදින්නට සරලා මැඩම් අමතක නොකරයි.

මම කල්පනා ගාවට කිට්ටු වූයෙමි.

**"කල්පනා ඕවා ගණන් ගන්න එපා. ඔය ගෑනිගෙ හැටි ඔහොමනෙ. ඔයා ඒක දන්නවනේ."** මම සුපුරුදු සිත සැදීමේ වැකිය පැවසුවෙමි. වෙනදට මා මෙය කියනවිට කල්පනා සිත හදාගන්නට උත්සාහ කරන්නීය.

අද කල්පනා කඳුළු පිරි දෑසින් හිස ඔසවා මා දෙස හෙළුවේ අසරණ බැල්මකි. එකවරම ඒ අසරණ බැල්ම කෝපවත් පෙනුමකට හැරුණි.

**"ඔව් ඒ ගෑනිගේ හැටි එහෙම තමයි. ඉතින් මගේ හැටි මොකක්ද?"** කල්පනා ඇසූ ප්‍රශ්නයේ අර්ථය තේරුම්ගත නොහැකිව මම උඩ බිම බැලුවෙමි.

**"ඒ කිව්වේ මොකද්ද?"** මම නැවත ඇසුවෙමි.

**"සරලා කියන්නේ නපුරු අනිත් අයගේ හිත රිද්දන චරිතයක් කියලා අපි හැමෝම දන්නවා. ඒ එයාගේ හැටි කියලා අපි පිළිගන්නවා. ඉතින් මගේ හැටි මොකක්ද? මගේ හැටි වෙන්න ඕනේ හැමදාම ඒක ඉවසගෙන අඬාගෙන ඉන්න එකද? මම කරන්න ඕනේ අඬලා ඒවා ඉවසන එකද? කිසිම වරදක් නැතුව බැණුම් අහන එකද මගේ හැටි?"** කල්පනා ඇසුවේ මාව නිරුත්තර කරමිනි.

ඇත්තටම මට ඇයට දෙන්නට පිළිතුරක් තිබුණේ නැත. පුද්ගලයෙකු නපුරු නම් දුෂ්ට නම් ඔහුට විරුද්ධ වන්නට බිය නිසා අපි ඒ ඔහුගේ හෝ ඇයගේ හැටි කියා හිත හදාගන්නට පුරුදු වී සිටින්නේ අපගේ බියගුලුකම නිසාය. මට කල්පනා ඇසූ ප්‍රශ්නය හොඳින්ම වැටහිණි. බැණුම් අසා හඬා වැටෙන කල්පනාට අප හැමදාමත් කීවේ එවැනි සිත රවටන අවවාදය.

සරලා මැඩම්ගේ තනතුරටත් නපුරුකමටත් අප බිය නිසා අප සැමදා සිතුවේ කල්පනා ඇතුළු වින්දිතයන් ඒ සරලාගේ හැටි කියා හිත හදාගත යුතු බවය.

**"මට තේරෙනවා කල්පනා ඔයා කියන්න හදන දේ. ඉතින් අපි මොනවද කරන්නේ? අපිට මොනවද කරන්න පුළුවන්?"** මම කල්පනාවෙන් ඇසුවෙමි.

**"මම තවත් ඉවසන්නේ නැහැ. මම HR එකට complain කරනවා."** කල්පනා කියද්දී මා පුදුමයට පත්වූයෙමි. නමුත් එය සුදුසුම ක්‍රියාව බව මටද වැටහුණි.

**"HR එක අපිව පිළිගනීද?"** මම කල්පනාගෙන් ඇසුවෙමි.

**"උත්සාහ කරලා බලනවා. සරලා මැඩම්ගේ තනතුරටයි, නපුරුකමටයි බයවෙලා හැමෝම ඉවසන නිසා අපි දන්නේ නැහැ ප්‍රතිඵලය මොකක් වෙයිද කියලා. අඩුම තරමේ උත්සාහ කරලවත් බලමු. HR එක මේ බව පිළිගන්නේ නැති නම් මම රස්සාවෙන් අයින් වෙලා අලුත් තැනකට යනවා."** කල්පනා කිව්වේ ස්ථිරසාර ලෙසය.

**"අනේ කල්පනා"** මට කියැවුණි.


**"මානසික සහනය කියන දේ හැමදේටම වඩා මට වටිනවා. මෙතන හොඳ ආයතනයක්. හැබැයි සරලා මැඩම් මගේ මානසික සහනය නැත්තටම නැති කරනවා. මේ ප්‍රශ්නය මම විසඳගත්තේ නැත්නම් කවුරු මට විසඳලා දෙන්නද? ඒ නිසා මම පළවැනි පියවර තියනවා. ඒ තමයි HR එකට complain කරන එක. HR එක මගේ ප්‍රශ්නය විසඳලා දුන්නේ නැත්නම් මම දෙවැනි පියවර ගන්නවා. ඒ රැකියාව මාරුකරන එක."** ඇය කීවාය.

**"ඔයාට හොඳයි කියලා හිතෙන දෙයක් කරන්න."**

මම අවසානයේදී කල්පනාට පැවසුවෙමි. කල්පනා HR එකට complain කළාය. ප්‍රතිඵලය නොසිතූ විරූ ලෙස යහපත් විය.

ඔවුන් පැරණි දිනවල සීසීටීවී කැමරා දර්ශන පරීක්ෂාකර තිබුණි. කිසිම සාධාරණ හේතුවක් නොමැතිව සරලා මැඩම් හැමෝගෙම සිත් රිදවන හැටි ඔවුන් ඒ මගින් දැකගෙන තිබුණි. සරලා මැඩම්ට අවවාද කර වෙනත් බ්‍රාන්ච් එකකට ඇය මාරු කර යවන්නට පාලනාධිකාරිය පියවර ගෙන තිබුණි.

■ සමාධි ඩයස්



# කකුලෙ කොටු රෑල් නම් මඟුල කොට උඩ

"ස්... ස්... නංගි... නංගි මට අද ගණන් පොත ගේන්න අමතක වුණා. කකුලේ තියෙන කොටුරෑල් ටික දෙනවද ගණන් ලියන්න?"

ගණන් පන්තියේ කොල්ලෝ කුරුට්ටෝ ටික සඳමාලිට එහෙම කියලා හිනාවුණා. අරියාදු විහිළුවට හිත රිද්දගත්තු සඳමාලි එහෙම්මම බිම බලාගත්තා.

ඔය කියාපු සිද්ධිය වෙලා දැන් අවුරුදු ගාණක් ඇති. හැබැයි මේ මෑතකදිත් මට සඳමාලිව හම්බුණා. එදා වගේම තාමත් එයාගේ කකුලේ කොටු කොටු තියෙනවා.

කකුල්වල ගණන් ලියන්න පුළුවන් සයිස් එකට කොටු තියෙන ගෑනු ළමයෙක් දැක්කහම සමහරු 'කොටුරෑල් කෙල්ල, කොරපොත්ති' වගේ නම් දාලා ඒ අයට විහිළු කරනවා. විහිළු කරලා නවතිනවා නම් බැරියෑ. කොරළ තිබුණු ගෑනු ළමයෙක්ට වෙච්චි ඇබැද්දියක් ගැන මනෝඋපදේශිකාවක් දවසක් මරු කතාවක් කිව්වා.

එක පිරිමි ළමයෙක් ගෑනු ළමයෙක් එක්ක හාදවෙලා. ඔය කියන පිරිමි ළමයා අර අම්මගේ වචනෙට පිටින් නොයන මමාස් බෝයි කෙනෙක්ලු. ඉතින් දවසක් කොල්ලා අම්මට කෙල්ලව පෙන්නලා. ගෑනු ළමයගේ කියන්න කිසිම අඩුපාඩුවක් තිබිලා නැහැ. හැබැයි කෙල්ලගේ කකුලේ කොරළලු. අර කියන්න එකක් නැත්තම් නහය මුක්කං කියන්නා වාලේ ගෑනු ළමයගේ කකුලේ කොරළය කියලා අම්මා මඟුලට අකමැති වෙලා. පස්සේ අම්මා අකමැතිය කියලා පුතත් සම්බන්දේ නතර කළාලු. ඔය හේතුව නිසා මානසිකව වැටුණු ගෑනු ළමයා උපදේශනයට අර මනෝඋපදේශිකාව ළඟට ඇවිල්ලා. කකුලේ තියෙන කොරළ ගැන වුණත් ඒ යුවතිය හරියට වද වුණාලු.

කකුලේ හැදෙන කොරළ නිසා ගොඩක් කාන්තාවෝ මානසිකව ලතැවෙනවා. අනික මේ තත්ත්වය එක්ක ලස්සනට කොටට ඇඳුමක් අඳින්න කාරියත් අපහසුයිනේ. ඉතින් කොරළ ගැනයි නිට්ටාවටම කොරළ සුව කරන සත්කාර කීපයක් ගැනයි අද ලිපියෙන් කතා කරන්න හිතුවා.

කකුල්වල කොරල හැදෙන්නේ කොහොමද කියලා මුලින්ම බලමුකෝ. අපේ හමේ තෙල් නැත්තම් සීබම් නිපදවන ග්‍රන්ථි තියෙනවා. හමේ තෙතමනය ආරක්ෂා කරගන්නේ ඔය තෙල්වලින්. අර කියාපු ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය අඩු

**දකුණු පළාතේ උදවිය අතර කොරළ තත්ත්වය ටිකක් වැඩියි. ඒ අයට මේක පරම්පරාවෙන් උරුම වෙනවා කියලයි කියන්නේ**

වුණාහම සීබම් හැදෙන එක අඩු වෙනවා. පස්සේ සමේ තෙතගතිය අඩුවෙලා චර්ම සෛල මැරෙන්න ගන්නවා. ඒ විතරක්නම් බැරියැ, මැරුණු සෛල එකට එක්කාසු වෙලා කොරස්තරය කියලා ඝනකම් සෛල තට්ටුවක් හැදෙනවා. ආන් ඒකට තමා අපි කොරළ කියලා කියන්නේ. ගොඩක් වෙලාවට මේ තත්ත්වය ඇතිවෙන්නේ කකුල්වල. කලාතුරකින් සමහරුන්ගේ අත්වලත් කොරළ එනවා. ඒ වගේම වැඩිපුරම කොරළ හැදෙන්නේ ගෑනුන්ට.

කොරළ හැදෙන්නේ තෙල් ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය අඩුවුණාම කියලා කිව්වනේ. ඒවයේ ක්‍රියාකාරීත්වය අඩුවෙන්න බලපාන හේතු මොනවද කියන එකයි වැදගත්ම කතාව.

මුල්ම එක තමයි ජානමය උරුමය. දකුණු පළාතේ උදවිය අතර මේ කොරළ තත්ත්වය ටිකක් වැඩියි. ඒ අයට මේක පරම්පරාවෙන් උරුම වෙනවා කියලයි කියන්නේ.

වියළි පළාත්වල ජීවත්වෙන අයටත් කොරළ ඇතිවෙන්න තියෙන ඉඩ වැඩියි. ඒ වගේම නිතරම උණුවතුර ස්නානය, රේසර් භාවිතා කරලා කකුලේ අනවශ්‍ය රෝම ඉවත් කිරීම, ප්‍රමිතියක් නැති ආලේපන භාවිතයත් කොරළ හැදෙන්න හේතුයි. තව එතකොට දියවැඩියාව, තයිරොයිඩ් ග්‍රන්ථියේ ගැටලු, වකුගඩු, අක්මාව ආශ්‍රිත රෝග, විටමින් ඌණතා වගේ දේවල් ඇඟ ඇතුළේ තියෙනවානම් ඒවගේ රෝග ලක්ෂණයක් විදියටත් සමහරුන්ට කොරළ එනවා.

දැනටම කොරළ හැදිලා තියෙන කෙනෙක් නම් මුලින්ම කරන්න ඕනේ හොඳට වතුර බොන එක. දවසට වතුර ලීටර 2ක් අනිවාර්යයයි ඔන්න. උණුවතුරෙන් නාන, ඇඟ සෝදන එක අඩු කරන්න. අපි රෙදි සෝදන්න භාවිතා කරන සබන් කුඩු හරියට සේදුනේ නැතුවමත් ඒවයේ තියෙන රසායනික සංයෝග කෙළින්ම අපේ ශරීරවල තැවරෙනවා. ඒ වගේ දේවලුත් කොරළ වැඩිවෙන්න බලපානවා. ඉතින් කොරළ තියෙන කෙනෙක් නම් ඇඟ සෝදන්න වගේම රෙදි සෝදන්නත් මෘදු සේදුම්කාරක පාවිච්චි කරන්න.

අව්වේ යනවා නම් අනිවාර්යයෙන්ම කකුල්වලත් සන්ක්‍රීම් ගාන්න. උදේට, දවල්ට, රෑට තුන්පාරක් කොරළ සම මොයිස්චරයිස් කරන්න. සැලිසිලික් ඇසිඩ්, හයලුරොනික් ඇසිඩ්, ග්ලසරින්, කොකෝවා, ආමන්ඩ්, ඔලිව් වගේ දේවල් අඩංගු අලේපන කොරළ සමට පංකාදුයි.

අලිගැටපේර, නැවුම් කිරි, යෝගට්, ගොටුකොළ, බිත්තර, ආමන්ඩ්, පොල් ලොඳ, පොල්වතුර වගේ විටමින් A අඩංගු ආහාර ටිකක් වැඩිපුර ගන්න. ඔය දේවල් කරන ගමන් ගෙදරදිම මේ සත්කාර ටිකත් කරලා බලන්න.

ඔලිව් තෙල්, ලෙමන් යුෂ, බේකින් පවුඩර් සමාන ප්‍රමාණවලින් අරගෙන වතුර ටිකක් දාලා කොරළ සමේ ගාන්න. විනාඩි 20ක් තියලා හෝදලා අරින්න.

මුංඇට පිටි 50gකට එළඟිතෙල්, තල තෙල් දාලා හොඳට මිශ්‍ර කරලා කකුලේ ආලේප කරන්න. පැය බාගයක් තියලා සෝදන්න.

ආනමාළු ගෙඩියක් පොඩි කරලා ඒකට තල තෙල්, එළඟිතෙල්, මී පැණි මිශ්‍ර කරලා කොරළවල ගාන්න.

පිරිසිදු තැඹිලි තෙල් ටිකක් අරගෙන ඒකට හීන් උළුපියලියා ටිකක් කොටලා දාලා රත් කරලා කොරළ කකුලේ ගාන්න.

මේ කියපු දේවල් හරියටම කළොත් සඳමාලිට වගේ ඔයාලට කාගෙන්වත් කයි කතන්දර අහන්න වෙන්නේ නැහැ. ලස්සනට කකුල ටිකක් පේන ඇඳුමක් අඳින්න දෙපාරක් හිතන්න ඕන වෙන්නෙත් නැහැ. හැබැයි මේ දේවල් කරලත් කොරළ සුවවුණේ නැත්නම් වෛද්‍යවරයෙක් ගාවට යන එක තමයි රජෝ නුවණට හුරු.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# මං මැච් බලන්න බයවුණාට එයා ආයෙත් ක්‍රිකට් ගහනවා බලන්න ආසයි

## ලහිරු තිරිමාන්නගේ බිරිඳ රුක්ෂානි

**1996 ලෝක කුසලාන ක්‍රිකට් ජයග්‍රහණයෙන් පසු ශ්‍රී ලංකා කණ්ඩායමට රිසිසේ දස්කම් දක්වන්නට අවස්ථාවක් උදාවිණි නම් ඒ 2014 වසරේය. ඒ ඓතිහාසික ජයග්‍රහණ රැසකටම උරුමකම් කියන්නට එම වර්ෂයේදී අපේ කණ්ඩායමට අවස්ථාව ලැබුණු නිසාවෙනි. මගේ මතකය නිවැරදි නම් ඒ 2014 මාර්තු 08 වැනිදාය. එදා බංග්ලාදේශයේ ඩකා පිටියට දහස් ගණනක ක්‍රිකට් ප්‍රේක්ෂකයින් පැමිණ තිබුණේ ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර පැවති ආසියා කුසලාන තරඟමාලාවේ අවසන් මහා තරඟය නැරඹීමටයි. එහිදී මුලින් පන්දුවට පහරදුන් පාකිස්තානය පන්දුවාර 50 තුළ ලකුණු 260ක් ලබාගත්තේය. ඩකා පිටියේ අතීත දත්තයන් හා සැසඳූ විට එය ශ්‍රී ලංකාවට ලේසිපහසු ඉලක්කයක් නොවිණි. නමුත් ශ්‍රී ලංකා පිතිකරුවන් සාර්ථකව එකී ඉලක්කය හඹායද්දී කාගේත් අවධානය යොමුවූයේ ආරම්භක පිතිකරු ලහිරු තිරිමාන්නගේ සුපිරි පිහිහරඹය වෙතය. ඔහු එහිදී ලකුණු 101ක් ලබාගත් අතර කඩුලු පහකින් තරඟයේ ජයග්‍රහණයද ශ්‍රී ලංකාවට හිමිවිය. එවර තරඟාවලියේ වීරයාද ඔහුය. නමුත් දක්ෂතා අතර සිටියදීම මේ සුපිරි පිතිකරුවා මේ වනවිටත් කණ්ඩායමෙන් ගිලිහී තිබේ. එවන් මොහොතක මේ කතාබහ දැනට ඕස්ට්‍රේලියාවේ සිටින ලහිරු තිරිමාන්නගේ බිරිඳ වන රුක්ෂානි තිරිමාන්න සමඟිනි.**








**2007 අවුරුද්ද කියන්නේ රුක්ෂානිට අමතක නොවෙන අවුරුද්දක් වෙන්න ඇති නේද?**

කොහොම අමතක කරන්නද? ඒ අවුරුද්දේ තමයි ලහිරු තිරිමාන්නයි මමයි මුණගැහුණේ.

**ලහිරු තිරිමාන්නව ඔයාට මුණගැහුනේ කොහොමද?**

අපි මුණගැහුනේ උසස් පෙළ ටියුෂන් පන්ති යනකොට. එයා උසස් පෙළ කළේ ගණිත විෂය ධාරාවෙන්. මං කළේ විද්‍යා විෂය ධාරාවෙන්. ඉතින් අපි දෙන්නගේම විෂය ධාරාවන්වල පොදු විෂයක්නේ රසායන විද්‍යාව. රසායන විද්‍යාව පන්තියෙදි තමයි ලහිරුයි මමයි මුණගැහුනේ.

**ඒ මුණගැහීම ආදර කතාවකින්ම අවසන් කරන්න හිතුවේ මොකද?**

අපි ටික කාලයක් යාළුවෝ වගේ හිටියා. එහෙම ඉන්නකොට තමයි ලහිරු ආදර යෝජනාවක් ගෙනාවේ. ඉතින් අකමැති වෙන්න හේතුවක් තිබුණේ නෑ. පස්සේ යාළුකම ආදරේකට හරවා ගත්තා.

**හැබැයි ඒ ආදර කතාවට වැඩි ආයුෂ තිබුණේ නැතිලු නේද?**

(සිනාසෙමින්) ඔව් ඔව් අපි ආදරේ කරන්න පටන් අරන් ටික දවසකින් වෙන්වුණා. ඒක අපි දෙන්නම හිතලා ගත්ත තීරණයක්. මොකද ඒ වෙනකොට අපි හිතුවා උසස් පෙළ විභාගය ජේනමානේ තියාගෙන ආදරේ කරන්න ගිහිල්ලා විභාගය හරියට කරගන්න බැරිවෙයි කියලා. එහෙම හිතලා අපි දෙන්නම කතා කරලා ආදර සම්බන්ධය නැවැත්තුවා. හැබැයි යාළුවෝ විදියට කතාබහ කළා.

**එතකොට එදා එහෙම වෙන්වුණු දෙන්නා අද එක වහලක් යට ඉන්නේ කොහොමද?**

උසස් පෙළ ලිව්වට පස්සේ ඉතින් අපි ආයෙත් ආදර සම්බන්ධය පටන්ගත්තා. අවුරුද්ද කිව්වොත් ඒ 2008 අවුරුද්දේ. ඊටපස්සේ අවුරුදු හයක් ඒ විදියට ආදරේ කරලා 2014 අවුරුද්දේ ලහිරුයි මමයි විවාහ වුණා.

**දෙන්නගේ විවාහයට කලින් ලහිරු තිරිමාන්න ජාතික කණ්ඩායමට තේරුණා නේද?**

ඔව් 2010 අවුරුද්දේ තමයි එයා ජාතික කණ්ඩායමට තේරුණේ. එතකොට අපි ආදරේ කරන්න පටන් අරන් අවුරුදු දෙක තුනයි. හැබැයි එච්චර ඉක්මනට එහෙම අවස්ථාවක් ලැබෙයි කියලා මං නම් හිතුවේ නෑ.

**ක්‍රිකට් ක්‍රීඩකයින්ට තරුණියන්ගේ ලොකු ආකර්ෂණයක් තියෙනවනේ. ඉතින් ලහිරු ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරද්දි රුක්ෂානිට ඒක දැනුණේ කොයි විදියටද?**

ලහිරුයි මමයි අතරේ ඒ වෙනකොට හොඳ අවබෝධයක් තිබුණා. අපි අපිව හොඳටම තේරුම් අරන් හිටියේ. ඉතින් ඒ නිසාද මන්දා මට ඒක ලොකුවට දැනුණේ නෑ. ඇත්තම කිව්වොත් එයත් එක්ක ෆොටෝස් ගහන්න එන ගෑනු ළමයි ඉස්සරහා මං එයාලගේ කැමරාමන් වුණු වෙලාවල් පවා තියෙනවා.

**විවාහයෙන් පස්සේ දැන් ලහිරුත් එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

දැන් අපි ඉන්නේ ඕස්ට්‍රේලියාවේ. ලහිරු මෙහේ ක්‍රිකට් ඇකඩමි එකක් කරනවා. අපිට අවුරුදු හයක පුතෙකුයි අවුරුදු එකහමාරක දුවෙකුයි ඉන්නවා.

**ඕස්ට්‍රේලියාවට වෙලා ඉන්නේ ලංකාව එපා වෙලාද?**

එහෙම දෙයක් නෙවෙයි. අපි දුව ඉපදෙන්න ඉන්නකොට ටික කාලෙකට ඕස්ට්‍රේලියාවට ආවේ. ඒ වෙනකොට ලහිරු ජාතික කණ්ඩායමට ක්‍රීඩා කළා. ඒත් ඊටපස්සේ එයාට කණ්ඩායමට කතා කළේ නෑ. එයාට ආයෙත් ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න අවස්ථාවක් ලැබුණොත් අනිවාර්යයෙන්ම අපි ලංකාවට එනවා.

**ආයෙත් ලහිරු තිරිමාන්නට කණ්ඩායමේ ස්ථානයක් ලැබෙයි කියලා රුක්ෂානි හිතනවද?**

එහෙම ලැබෙනවා නම් ආසයි. මොකද එයා වගේ අත්දැකීම් බහුල ක්‍රීඩකයෙක් කණ්ඩායමේ ඉන්න එක හරි වටිනවා. අනික එයා 2014 විස්සයි විස්ස ලෝක ශූර කණ්ඩායමේ ක්‍රීඩකයෙක්. ක්‍රිකට්වල තරඟ රටා තුනටම ගැළපෙන ක්‍රීඩකයෙක්. ඉතින් මං හිතනවා තව අවුරුදු කීපයක් ලහිරු තිරිමාන්න කණ්ඩායමේ ඉන්න ඕනේ කියලා. එහෙම අවස්ථාවක් ලැබුණොත් එයත් ඒකට ලෑස්තියි. එයත් හරිම ආසාවෙන් ඉන්නේ ආයෙත් කණ්ඩායම එක්ක එකතුවෙන්න.

**අපිට දැනගන්න ලැබුණා රුක්ෂානි ලහිරු බැට් කරනවා බලන්න හරි බයයි කියලා. ඇත්තද?**

(සිනාසෙමින්) කොහෙන්ද ඒක දැනගත්තේ? ඔව් ඒ කතාව ඇත්ත. ඒ නිසා මං එයා ඉන්න මැච් බලන්නේ හරිම අඩුවෙන්. එහෙම බැලුවා නම් ඒ මැච් කීපයක් විතරයි.

**ක්‍රිකට් පිටියෙදි නම් ලහිරු කියන්නේ නිවුණු ක්‍රීඩකයෙක්. එයා ගෙදරදිත් එහෙමද?**

එහෙම ලොකු වෙනසක් නෑ. බැඳලා අවුරුදු දහයකට කිට්ටුවෙන්න ආවත් දෙන්නා තාමත් අලුත බැඳපු ජෝඩුව වගේ තමයි ඉන්නේ. ලේසියකට එයාට තරහා යන්නේ නෑ. ඒක නිසා එයත් එක්ක ජීවත්වෙන්න ලේසියි.

**ක්‍රිකට් ක්‍රීඩකයෝ විවිධ විලාසිතා කරනවා. ලහිරු එහෙම නොකළේ ඔයාට තියෙන බයේ කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) බොරු බොරු මං එයාගේ ෆැෂන්වලට නම් අතදන්නේ නෑ. එයා 2014 කාලේ වගේ කොණ්ඩේ එහෙම කලර් කරලා හිටියා.

**සමහරු කියනවා ලහිරු තිරිමාන්නයි විරාට් කෝලියි ටිකක් එක වගේ කියලා. අපි නොදන්න නෑකමක් එහෙම දෙන්නට තියෙනවද?**

(සිනාසෙමින්) එහෙම නෑකමක් නම් නෑ. ඒත් දෙන්නගේම පෙනුම ටිකක් එක වගේ කියලා මටත් හිතෙනවා.

**ලහිරු තිරිමාන්නගේ ආදරණීය බිරිඳ විදියට එයාගේ ක්‍රිකට් ජීවිතේ ඔයා දකින්න ආසම හීනයක් තියෙනවද?**

එක හීනයයි තියෙන්නේ. ඒ එයා ආයෙත් ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරනවා දකින එක. තවත් මාස කීපයකින් එක්දින ලෝක කුසලානය තියෙනවා. මං හිතනවා ලහිරුට ඒකට ක්‍රීඩා කරන්න අවස්ථාවක් ලැබුණොත් එයා එයාගේ උපරිමය කණ්ඩායමට දෙයි කියලා.

■ රුවන් එස්.සෙනවිරත්න

**මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි**

# අලුත් ඇඳුම් ඇඳගෙන පරණ වන්නම නටමුද?



**දවසක්දා මට ඒ උන්දැව මුණගැහුනා ගමේ පිරිත් ගෙදරකදි. ඒ වෙලාවේ මම ඇහුවා "කොහොමද මහත්තයෝ අවුරුදු එහෙම? මොනවද කරන අලුත් වැඩ?" කියලා. ඒ වෙලාවේ ඔහු ගත්කටටම කිව්වේ "මොන අලුත්ද සර්. කලින් ඈයෝ ගල් අල්ලපු පාරක්වත් හොයාගෙන අලුතෙන් ගල් ටිකක් අල්ලගත්තොත් ගොඩ" කියලා**

**'පිටරටින් එන සාල නැවතුණි නම්**
**අපට කෑම නැත**
**පිටරටින් එන රෙදි නැවතුණි නම්**
**අපට විලි වැස්මක් නැත**
**පිටරටින් එන යාන නැවතුණි නම්**
**අපට ගමන නැත**
**කොටින්ම පිටරට පිහිට නැත්නම්**
**අපට කිසිවක්ම නැත**
**ඒ නිසා පරණ වූ අලුත් අවුරුද්දකින් අපට**
**කිසිඳු පලක් නැත'**

මුනිදාස කුමාරතුංගයන් මෙහෙම කියලා තියෙන්නේ 1941 දී එතුමගේ මූලිකත්වයෙන් පටන්ගත්තු 'හෙළ ජාතික හවුල' සංවිධානය සමාරම්භක අවස්ථාවේදී. ඔහු මේ සංවිධානය ආරම්භ කරලා තියෙන්නෙත් ඒ වෙනකොට විශාල තර්ජනයකට ලක්වෙලා තිබුණු සිංහල ජාතියත් සංස්කෘතියත් රැකගැනීම් අරමුණින්ලු.

කුඹුරු ටික අස්වද්දන්නෙ නැතුව සුද්ද හාල් ටික එවනකම් උඩ බලාගෙන ඉන්නකොට, විලි වහගන්නෙත් උන්දැලාගෙ වස්තරෙන්කොට, උජාරුවට යන්නෙ උන්දැලගෙන් ගෙනාපු වාහනවලින්කොට, පරණ අවුරුද්ද ගෙවෙනකොට නාලා, පරණ ඇඳුම විතරක් මාරු කළාට අවුරුද්දක් අලුත් වෙනවද කියලයි මේ අහන්නේ.

**'අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව**
**නොනගී**
**හිඟා කෑම බැරිවුණ තැන ලගී ගයා මර ගී**
**ගැමි වහරින් හද පොපියන අරුත් රසය**
**නොනැගී**
**මග දද ගණ උපදින කලැ පර දෑ අතගී'**

මේකත් එතුමා අතින්ම ලියැවුණු කවියක්. ඒ කාලේ පැරණි උදවිය අලුතෙන් හිතලා තමන්ටම ආවේණික වුණු අලුත් දේවල් හොයාගත්තා. ඒ නිසා එද ඇත්තන්ගෙන් රටට වගේම ජාතියටත් පලක් තිබුණා. ඒ නිසා රට වගේම මිනිස්සුන්ගේ ජීවිතත් දවසින් දවස ඉස්සරහට ගියා. ඒත් ඉදිරියට බිහිවෙන අලුත් පරම්පරාවේ වැඩි හරියක් දෙනා උත්සාහ කරන්නේ අනුන්ගේ පානින් එළිය දකින්න විතරයි. හැල්මේ දුවන ලෝකයත් එක්ක ඒ ඇත්තන්ට අලුතින් හිතලා අලුතින් දෙයක් කරන්න වෙලාවක් වගේම උවමනාවකුත් නෑ.

ඉතින්, පලකට ඇති වැඩක් නොකොට රට්ටුන්ට පේන්න විතරක් චාරිත්‍ර වාරිත්‍ර කරගෙන කාලා බීලා විතරක් සතුටුවෙන ජාතියකට අවසානේ බඩගින්නේ මැරෙන්න සිද්ධවෙනවා කියලයි මේ කියන්නේ.

ඔය කතා දෙක අහනකොට කෙනෙකුට එකපාරම හිතෙන්න පුළුවන් අපිත් කරන්නේ මේකම නෙවෙයිද කියලා. ගොඩක් උදවිය අලුත් අවුරුද්දට ගෙවල් අලුත් කරන්න පටන්ගන්නේ සති ගාණක ඉඳන්. ඊටපස්සේ අලුත් අවුරුද්ද දවසෙ නැකතට අඳින්නයි, අවුරුද්දෙන් පස්සේ රස්සාවට යන්නයි වෙවොරණ ඇඳුම් පැළඳුම් ටිකකුත් ගන්නවා. එතැනින් නවතින්නේ නෑනේ. නෑදෑ හිත මිත්‍රාදීන්ට දෙන්න තෑගි බෝග පවා අරගන්නවා. ඊටපස්සේ නැකතට කිරි උතුරවලා, කැවුම් කිරිබත් කාලා රතිඤ්ඤා පත්තු කරලා සුබ මොහොතින් අලුත් අවුරුද්දක් පටන්ගන්නවා. මේ කියන්නේ එහෙම කරන එක වැරදියි කියලා නම් නෙවෙයි. හැබැයි එහෙව් උදවියම එදට පහුවද ඉඳන් ආපහු වැඩ කරන්නෙ, හිතන්නෙ පතන්නේ අර පරණ පුරුදු විදියටමයි. එහෙම වුණාහම ඒ ජීවිතවල දියුණුව සාර්ථකත්වයත් පරණ තැනම නවතිනවා. කොටින්ම කියනවා නම් ගොඩක් උදවිය අවුරුද්දට පස්සෙ ආපහු සැරයක් ගත කරන්නේ අලුත් නොවුණු පරණ අවුරුද්දක්ම තමයි.

එහෙමනම් අපි මේ උදාවුණ අලුත් අවුරුද්ද සැබෑම අලුත් අවුරුද්දක් කරගන්නෙ කොහොමද?

ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා සමඟින්.

මුනිදාස කුමාරතුංග මහත්තයා එද ඔය කියලා තියෙන කතා ටික අද කාලෙටත් හරියටම ගැලපෙනවා. ඒ විතරක් නෙවෙයි එද රජගොල්ලොත් ඔය ටික ඔය විදියටම කියලා තියෙනවා.

මොකද අද ගොඩක් උදවිය අවුරුද්දට අලුත් කරන්නේ ගෙදර තීන්ත ටිකයි, දොර ජනෙල්වල තිරරෙදි ටිකයි, අඳින ඇඳුම් ටිකයි විතරයි.

ඊටපස්සේ සමහරු අවුරුද්දෙන් පස්සේ අර තිරරෙදි ටිකත් ගලවලා ආපහු සැරයක් පෙට්ටගමටම දාලා වහනවා. අවුරුදු දාට විරතක් මූනිච්චාවට හිනාවෙලා කතා කරපු මූණු ටික ආපසු සැරයක් පරණ විදියටම ඇකිළෙනවා.

රජයේ වේවා පෞද්ගලික අංශයේ වේවා රැකියා කරන උදවිය පුරුදු විදියටම උදේට ගිහින් රෑට ගෙදර එනවා. අලුත් දෙයක් හිතන්න කරන්න ඒ සමහරුන්ට උවමනාවකුත් නෑ. උනන්දුවකුත් නෑ. ඒත් එද ඇත්තො මහන්සි වුණේ අලුත් අවුරුද්දට අමුඩ ලේන්සුවයි, රෙද්දයි හැට්ටෙයි අලුත් කරගන්න විතරක්ම නෙවෙයි. ඔවුන් ක්‍රියාවෙනුත් අලුත් වෙලා පෙන්නුවා. පරණ අවුරුද්දට වඩා වැඩියෙන් අලුත් අවුරුද්දෙදි හාල් සේරුවක් හරි ගෙට ගන්නයි ඒ උන්දැලා මහන්සි වුණේ. අක්කර ගණන් හේන් ගොවිතැන් කරලා සුද්දටත් කන්න මුහුදෙන් එහාට කෑම ටික යැව්වා. ඒකනෙ අර සිංදුවකුත් තියෙන්නෙ 'අපි වවලයි අපි කෑවේ උත්තම රජගොල්ලො වගේ' කියලා.

ඊළඟට එද රජදරුවෝ වුණත් තමන්ගේ පාලන කාලය තුළ රටට දෙයක් කරලා තියෙනවා කියන එකට ඉතිහාසයත් සාක්ෂි දරනවා.

උදාහරණයක් විදියට කාශ්‍යප රජ්ජුරුවෝ හදපු සීගිරියෙන් අදටත් අපි තවමත් ආදායම් උපයනවා. පරාක්‍රමබාහු රජතුමාගේ පරාක්‍රම සමුද්‍රයෙන් දවසකට කොච්චර අදායමක් ලබනවද? අන්න එහෙමයි එද උත්තම රජගොල්ලො අවුරුද්දෙන් අවුරුද්දට ක්‍රියාවෙන් අලුත් වුණේ.

ඕකට මම තව උදාහරණයක් කියන්නම්.

මහනුවර පළාතෙ මම හොඳට දන්න ව්‍යාපාරික මහත්තයෙක් ඉන්නවා. උන්දැගේ ව්‍යාපාරය තමයි ප්‍රාදේශීය මට්ටමෙන් පාරවල් හදන්න ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගන්න එක. දවසක්ද මට ඒ උන්දැව මුණගැහුනා ගමේ පිරිත් ගෙදරකදි. ඒ වෙලාවේ මම ඇහුවා "කොහොමද මහත්තයෝ අවුරුදු එහෙම? මොනවද කරන අලුත් වැඩ?" කියලා. ඒ වෙලාවේ ඔහු ගත්කටටම කිව්වේ "මොන අලුත්ද සර්. කලින් ඈයෝ ගල් අල්ලපු පාරක්වත් හොයාගෙන අලුතෙන් ගල් ටිකක් අල්ලගත්තොත් ගොඩ" කියලා.

ඕන් ඔහොමයි අද උදවිය අවුරුදු අලුත් කරගත්තේ.

ඒ නිසා මගේ ආදරණීය දුවලා පුතාලා හැමෝටම මේ කියන්නේ දැන් අවුරුද්ද අපි සමරලා ඉවරයි. ඒ නිසා ඔය අලුත් ඇඳුම් පැළඳුම් ගත්තා වගේම දැන් ටිකක් අලුත් විදියට හිතන්න. අලුත් අවුරුද්දක අලුත් බලාපොරොත්තුවක් ඇතිවෙන්නේ සිතුම් පැතුම් සහ ක්‍රියාවන් අලුත් වුණාහම. ඉගෙනගන්න දරුවෙක් නම් ආපස්සට හැරිලා බලන්න පරණ අවුරුද්ද ඉවරවෙනකොට තමන් කොයිතරම් දුරට සාර්ථක වෙලාද කියලා. රැකියාවක් කරන කෙනෙක් නම් වෙලාව කළමනාකරණය කරගෙන තව අමතරව ආදායමකුත් ලබාගන්න කොහොමද කියලා හිතන්න. ඊළඟට කවුරුහරි කෙනෙක් තමන්ගෙම ව්‍යාපාරයක් කරනවානම් පහුගිය අවුරුද්දට වඩා අලුත් අවුරුද්දේ තමන්ගේ ව්‍යාපාරයට අලුත් යමක් එකතු කරගන්න විදියක් ගැන හිතන්න. එහෙම නැතුව නැකතට වැඩ කරලා අවුරුද්ද පුරාම පරණ වන්නම නැටුවට පලක් නැහැ.

අනිත් එක තමයි එද ඉඳලා අද වෙනකම් ගොඩක් උදවිය අවුරුද්දක් ලබනකොටම කියන්නේ තරහා මරහා අමතක කරගන්න කියන එක විතරයි. කවුරුත් කා ගැනවත් තියෙන තරහක් අමනාපයක් නැති කරගන්න නැකතක් ලබනකන් ඉන්න ඕන නෑ. ඒ ආකල්පය පරණයි කියලයි මට නම් හිතෙන්නේ.

අවසාන වශයෙන් මම කියන්නේ අලුත් විදියට හිතලා වැඩ කරමු. අලුත් පටන්ගැන්මකින් අලුත් සාර්ථකත්වයක් ළඟා කරගමු කියන එක.

■ **ලිහිණි මධුෂිකා**


Seri
NATURALS
George Steuart
ESTD 1835
GS &Co
BELIEVE
FAIRNESS CREAM
SAFFRON AND MILK
කුංකුම සහ කිරි සාරයෙන් සම පෝෂණය කර
සමට හානිකර නොවන ලෙස
පැහැපත් බවක් ලබා දේ
Seri
NATURALS
FAIRNESS CREAM
SAFFRON AND MILK
NET Wt. 1.76 oz/50g
රු. 265/- සිට ඉහළට
රසදිය, බ්ලීච් හා අහිතකර
රසායනයන්ගෙන් තොරයි

# ගෝඨාභය කිරඹකන්ද දරුවා මරා දැමුවේ කවුද?

## ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අතීතය හාරා අවුස්සයි




**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. හෙතෙම නීතිය නව්‍යකරණයට මෙන්ම නීතිය පිළිබඳ සරල අන්දමින් දැනුවත් කිරීමට සක්‍රියව දායක වන්නෙකි. නීති ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් උසුලන සිදුවීම් සම්බන්ධයෙන් ඔහු දක්වන අදහස් නීති ක්ෂේත්‍රයේ අයට පමණක් නොව, රටේ සාමාන්‍ය පුරවැසියන්ටද එකසේ වැදගත් වේ. මේ, එලෙස සැකසෙන ලිපි මාලාවේ එකොළොස්වැන්නයි.**

එල්ලා මරා දැමීම නීතියක් ලෙස ශ්‍රී ලංකාවේ සම්මත වූයේ 1802 වර්ෂයේදීය. 1812 පෙබරවාරි මාසයේදී එය මුල්වරට ක්‍රියාත්මක වූයේ ඉංග්‍රීසි ජාතිකයකු ඝාතනය කිරීමේ චෝදනාවට වරදකරුවකු වූවෙකුට එරෙහිවයි. අවසාන වරට ශ්‍රී ලංකාවේදී පුද්ගලයකු එල්ලා මරා දමා ඇත්තේ 1976 ජුනි මාසයේදීයි. ඒ කාල සීමා අතරතුරදී මෙරට දැඩි කතාබහට ලක්වූ ඝාතන සිදුවීමකට අදාළව මරණ දඬුවම ප්‍රකාශයට පත් කෙරිණ. ඒ, 1968 අප්‍රේල් 17 වැනිදායි. එදින බොහෝ පිරිසක් අධිකරණය භූමියට රැස්ව සිටියහ. පෝලින් ද ක්‍රෑස් සිදුවීම ලෙස ප්‍රචලිත වූ එම නඩුව සාමාන්‍ය ජනතාවගේ දැඩි අවධානයට පාත්‍ර වී තිබීම ඊට හේතුවයි. සාමාන්‍යයෙන් අපරාධයට ගොදුරු වූ තැනැත්තාගේ නමින් හෝ අපරාධය සිදු වූ ස්ථානයේ නමින් සිදුවීම ප්‍රසිද්ධ වෙයි. එහෙත් මෙම සිදුවීම ජනතාව අතර පැතිර ගියේ චූදිතයාගේ නමිනි. මහාධිකරණ විනිසුරුවරයා ජූරි සභාවේ බහුතර තීරණයට අනුව චූදිත කාන්තාවට එරෙහිව මරණ දඬුවම ප්‍රකාශයට පත්කළේය.

### ඔබ සැබෑ වරදකරු නිදහස් කළා

"මම මේ චෝදනාවට නිවැරදිකරු කියලා දිවුරා ප්‍රකාශ කරනවා. ළමයාගේ සිරුර නිවසට ගෙනා වෙලාවේ බිනාකා කියන කාන්තාවගේ මෙහෙකාර දරුවා කියා තිබුණා මේ දරුවා මියගිය දවසේ හවස වත්තලට ආවා කියලා. පස්වරු 2.30 - 3.00 අතර මම දරුවා ළිඳට තල්ලු කළා කියලා පැමිණිල්ල චෝදනා කරනවා. ඒත් එදා හවස 6.30ට විතර ළිඳෙන් වතුර ගනිද්දිත් සිරුරක් දැක්කෙ නෑ කියලා දේවස්ථානයේ මුරකරු මරණ පරීක්ෂණයේදී කියා තිබෙනවා. මම නිර්දෝෂයි කියලා ඉන් ඔප්පු වෙනවා. ඔබ විසින් සැබෑ වරදකරු නිදහස් කරනු ලැබ තිබෙනවා."



PAULINE DE CROOS SENTENCED TO DEATH

MISS PAULINE RUTH DE CROOS, THE ACCUSED IN THE KIRAMBAKANDA MURDER CASE WAS YESTERDAY SENTENCED TO DEATH BY THE CHIEF JUSTICE MR. H. N. G. FERNANDO, AFTER THE JURY FOUND HER GUILTY BY A 6—1 VERDICT OF THE MURDER OF GOTABHAYA KIRAMBAKANDA, THE ELEVEN-YEAR-OLD SON OF MR. DON BODHIPALA KIRAMBAKANDA.

INNOCENT

Chief Justice

ACQUITTED

BETTER PAY FOR LGS MEN

SECURITY OFF KATCHCHATIVU

නඩු විභාගය පුරා නිහඬව සිටි පෝලින් මරණ දඬුවම ප්‍රකාශයට පත්කිරීමට පෙර ඉංග්‍රීසි බසින් එලෙස පැවසුවාය.

### නීති සාහිත්‍යය වර්ණවත් කළ සිදුවීමක්

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න පෙන්වා දෙන්නේ මෙම නඩුව මෙරට නීති ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් උසුලන බවයි.

"මේ නඩුව නීති සාහිත්‍යය වර්ණවත් කළා කියන්න හේතු කීපයක් තියෙනවා. බොහෝ නීතිමය වර්ධනයන්ට මේක ඉවහල් වුණා. විශේෂයෙන්ම පරිවේෂණීය සාක්ෂි මත නඩුවක් රඳා පවතින විට ඒවායින් නඩුවක් ඔප්පු කරන්නෙ කොහොමද කියන එක පැමිණිල්ල පැත්තෙන් ගුරුකොට ගත හැකි තීන්දුවක්. නීතිය හදාරන සෑම කෙනෙකුම මේ නඩුව ගැන දැනගැනීම වටිනවා. ඒ වගේම මෙහි විත්තිකාරිය වරදකාරිය බවට පත්කිරීම ගැන ප්‍රබල කථිකාවක් පවතිනවා. මේ සිදුවීම ආශ්‍රයෙන් අපට ඉගෙනගැනීමට බොහෝ කරුණු තියෙනවා."

**කිසිඳු ඇසු දුටු සාක්ෂියක් හෝ විද්‍යාත්මක සාක්ෂියක් නොමැතිව පෝලින් ද ක්‍රෑස්ට මරණ දඬුවම නියම වෙයි**

### බැල්මක ඇසිල්ලෙන් දැල්වුණු ගින්න

බර්ගර් ජාතික තරුණියක වූ පෝලින් ද ක්‍රෑස් ඉංග්‍රීසි බසින් සාමාන්‍ය පෙළ දක්වා උගත්තාය. ඈ තමාගේම ක්‍රමයකට ජීවත් වූ තැනැත්තියකි. ප්‍රචලිත මිනුම් දඬු අනුව රූප සුන්දරියක නොවුණද ඇය ඇඳුමින් පැළඳුමින්, හිසකේ සැකසුමෙන් තමන්ට ආවේණික ක්‍රමයක් පවත්වාගෙන ගියාය. ඇයට වූයේ සරාගී පෙනුමකි. එනිසාමදෝ ඈ බොහෝ සෙයින් විරුද්ධ ලිංගිකයින්ගේ ආකර්ෂණයට ලක්වූවාය. අඩු වයසේදීම පෙම් කිරීමට පෙළඹුණු පෝලින් පෙම්වතුන් ගණනාවක් ඇසුරු කළාය. ඒ අතර සමාජයේ ඉහළ තරාතිරම්වල පුද්ගලයෝද වූහ. එහෙත් ඈ මුදල් වෙනුවෙන් ඔවුන් ඇසුරු කළ බවක්ද පෙනෙන්නට නැත. විවිධ පෙම්වතුන් ඇසුරු කරමින් සිටි ඇය පසුකාලීනව ස්ථිර ප්‍රේමයක වෙළී සිටියාය. එහෙත් එය ස්ථිර වූයේ තමාට වඩා දෙගුණයකින් පමණ වැඩිමහල් කිරඹකන්ද නැමැත්තාගේ ඇස් පෝලින්ගේ ඇස් හා එකිනෙක පැටලෙන ඇසිල්ල දක්වා පමණි. දෙදෙනාගේම හැඟීම් උණුසුම් වීමට වැඩි කලක් නොගියේය. ඒ උණුසුමින් තමාද දැවී අළු වී යනු ඇතැයි පෝලින්ට එදා මොහොතකටවත් නොසිතෙන්නට ඇත. කිරඹකන්දගේ සමාගමයට වඩාත් ඇලුම් කළ පෝලින් වෙනත් පෙම්වතුන් හා සබඳතා අත්හැරියාය. ඇය නව පෙම්වතා කෙරෙහි වැඩි බලාපොරොත්තු තැබුවාය. තමා විවාහ කරගැනීමට ඔහු සිය පියාට එකඟ වූ බව ඇය සිය දිනපොතේද සඳහන් කර තිබිණ.

### විවාහක පෙම්වතා

පෝලින් විවාහ කරගැනීමට පොරොන්දු වුවද කිරඹකන්ද ඒ වනවිටද විවාහක තිදරු පියෙකි. ඔහුද කාන්තාවන් ඇසුරට ප්‍රිය අයෙකු බවට තොරතුරු තිබිණ. කෙසේ වෙතත් පෝලින් කෙරෙහි දැඩිව බැඳුණු කිරඹකන්දට සිය බිරියගෙන් එය සඟවා තැබීමට නොහැකි විය. එනිසා නිවසේ ගැටුම්ද මතු විය. කිරඹකන්ද ගමන් යද්දී එකොළොස් හැවිරිදි බාල පුතා ඔහු සමඟ එවීමටද බිරිය කටයුතු කළාය. එහෙත් දරුවාගෙන් කිරඹකන්ද - පෝලින් සබඳතාවට බාධාවක් ඇති වූ බවක් දක්නට නැත. සුපුරුදු පරිදි ඔවුන්ගේ හමුවීම් සිදුකෙරිණ.

### පාසල් ඇරී නිවසට නොපැමිණි දරුවා

කිරඹකන්දගේ බාල දරුවා වූ ගෝඨාභය කිරඹකන්ද 1966 පෙබරවාරි 07 වැනිදා සුපුරුදු පරිදි ගල්කිස්සේ පිහිටි සිය පාසලට යාමට පිටත් වූයේය. එහෙත් ඔහු නැවත නිවසට පැමිණියේ නැත. පසුදා උදෑසන පාසලට ආසන්න දේවස්ථානයක තිබී දරුවාගේ මෘත ශරීරය හමුවිය. ලුනාව රෝහලේ පැවති පශ්චාත් මරණ පරීක්ෂණයේදී කියැවුණේ දියේ ගිලී හුස්ම හිරවී මරණය සිදුව ඇති බවයි. එය සියදිවි නසාගැනීමක් බවට මත පළ විය.

### සියදිවි හානි කරගැනීමක්ද? ඝාතනයක්ද?

මේ අතර දරුවාගේ මරණය සම්බන්ධව පෝලින් ද ක්‍රෑස් වෙත ඇඟිල්ල දිගු වන්නට විය. ඊට හේතුව වූයේ ඇය සහ දරුවාගේ පියා අතර පැවති සම්බන්ධයයි. දරුවාගේ පියාද විත්තිකරුවකු ලෙස නම් කෙරිණ. එහෙත් ඔහුට එරෙහි කිසිඳු සාක්ෂියක් නොතිබීම මත නඩු විභාගය අතරම ඔහුට නිදහස ලැබිණ. කිරඹකන්ද සමඟ විවාහ වීමට බාධාවක් වූ බැවින් පෝලින් දරුවා ඝාතනය කරන්නට ඇතැයි යන සැකය මතු විය. එහෙත් එහිදී මතුවන ගැටලුව නම් අනෙක් දරුවන් සම්බන්ධයෙන් ඇයට එම ගැටලුව මතු නොවූයේද යන්නයි. කෙසේ වෙතත් සිදුවීම වූ දා උදෑසන පෝලින් ගල්කිස්සේ වූ සිය නිවසින් පිටත්ව ඇත. ඒ අසල නිවසක වූ කාන්තාවක පෝලින් උදෑසනම පිටත්ව ගිය අයුරු දැක ඇත. අනතුරුව උදෑසන 7.10ට පමණ ගෝඨාභය දරුවා සිය පාසල අසලට පැමිණ තිබේ. එහෙත් ඔහු පාසලට ඇතුළු නොවී කාන්තාවක සමඟ පිටව ගිය බව පාසලේ වෙනත් සිසුවකු දැක ඇත. එම කාන්තාව පෝලින් බව පසුව එම සිසුවා අධිකරණයේදී හඳුනාගෙන ඇත.

### පෝලින් සහ ගෝඨාභය කිරඹකන්ද දේවස්ථානයක

එදිනම උදෑසන 8.30ට පමණ ගල්කිස්සේ වූ දේවස්ථානයකට පැමිණි පුද්ගලයකුට දැකගත හැකි වූයේ කාන්තාවක සහ දරුවකු එහි සිටින ආකාරයයි. දරුවා කිසියම් අපහසුතාවකින් සිටින බව ඔහු නිරීක්ෂණය කළේය. ඒ අනුව ඔහු ඒ ගැන කාන්තාවගෙන් විමසීය.

"දරුවට මොකක් හරි අසනීපයක්ද?"

"ඔව් ටිකක් සනීප නෑ වගේ."

ඒ අනුව ඔහු ඉන් පිටව ගියේය. එම සිදුවීමෙන් පැයකට දෙකකට පමණ පසු ඔහු දේවස්ථානයේදී එම කාන්තාව පමණක් දැක තිබේ. එහෙත් ඔහු ඇගෙන් කිසිවක් විමසා නැත. ඒ පෝලින් බව ඔහුද පසුව හඳුනාගත්තේය.



කිරඹකන්ද දරුවා

**පැමිණිල්ල විසින් ඇගේ නරක චරිතය මතු කරනු ලැබූ අතර අපරාධ නඩුවකදී විත්තිකරුගේ නරක චරිතය අදාළ නොවන බව සාක්ෂි ආඥා පනතේ 54 වගන්තියේ දැක්වෙයි. එබැවින් පෝලින් ද ක්‍රෑස්ට පැනවූ මරණීය දණ්ඩනයට එරෙහි අභියාචනයේදී කීර්තිමත් රාජ නීතීඥයකු වූ ජී. ඊ. චිට්ටි පැවසුවේ ඇගේ නරක චරිතය පිළිබඳ සාක්ෂි ජූරි සභාවේ මනසට තදින් කාවදින්නට ඇති බවයි.**

### විවේක කාලයේ පාසලේ සිටි දරුවා ළිඳ අසලට

මේ අතර දරුවා විවේක කාලයේදී පාසලේ සිටි බවට දරුවකු සාක්ෂි දී තිබිණ. ඔහු නැවත දහවල් දෙකට පමණ පෙර කී දේවස්ථානයේ පිටුපස ඇති ළිඳ අසලට කාන්තාවක සමඟ පැමිණ ඇත. අසල සිටි අයෙක් ඒ බව දුටුවේය. දරුවා සහ කාන්තාව ජලය සොයන්නේ යැයි සිතූ ඔහු ඒ ගැන විමසා ඇත. අසල කරාමයක් තිබෙන බවද ඔහු පවසා තිබේ. එහෙත් කාන්තාව ඊට ප්‍රතිචාර දක්වා නැත. ඇය පෝලින් බව ඔහු උසාවියේදී හඳුනාගෙන ගත්තේය.

### පාසල් බෑගයක් කැලෑවට

මේ අතර එදින පස්වරු 3ට පමණ කාන්තාවක කැලෑබද පෙදෙසකට පාසල් බෑගයක් විසිකරන අයුරු දුටු බවට පුද්ගලයෙක් සාක්ෂි දුන්නේය. පසුව එම පොත් බෑගය සහ එහි වූ පාවහන් යුගලක් මියගිය ගෝඨාභය කිරඹකන්ද දරුවාගේ බව තහවුරු විය. ඊට පසු දින සැකකාර කාන්තාව තවත් අයෙකු සමඟ බෑගය විසිකළ ස්ථානය නිරීක්ෂණය කළ බවද ප්‍රදේශවාසියෙකු දැක තිබේ.

### ඇසු දුටු සාක්ෂි කිසිවක් නැති මරණයක්

දරුවා සහ පෝලින් එකට සිටීම දුටු පුද්ගලයින්ගේ පරිවේෂණීය සාක්ෂි හැරුණුකොට දරුවා ඝාතනයට පෝලින් සම්බන්ධ වූ බව කිසිවකු දැක නැත. එබැවින් සාධාරණ සැකයෙන් ඔබ්බට මෙම කරුණු තහවුරු කිරීම පැමිණිල්ලේ වගකීමකි.



කිරඹකන්ද යුවළ



දරුවා දමා තිබුණ ශාන්ත රීටා පල්ලියේ ළිඳ

### ජූරි සභාව ඉදිරියේ නඩු විභාගය

1989ට පෙර මිනීමැරීම, ස්ත්‍රී දූෂණය, මිනීමැරීමට තැත් කිරීම, ඒවාට ආධාර අනුබල දීම ආදිය සම්බන්ධයෙන් චෝදනා විභාග කෙරුණේ ජූරි සභාවක් ඉදිරිපිටදීය. එහෙත් 1989 අංක 16 දරන පනතින් අධිකරණ සංවිධාන පනතේ 11 වැනි වගන්තිය සංශෝධනය කිරීමෙන් සිය නඩුව ජූරි සභාවක් ඉදිරියේ විභාග කරනවාද නැද්ද යන්න තීරණය කිරීමට විත්තියට ඉඩ හිමිවිය. මෙම නඩුව විභාග කෙරුණේ සංශෝධනයට පෙර බැවින් පෝලින් ද ක්‍රෑස්ට එම අවස්ථාව ලැබුණේ නැත. පැමිණිල්ල විසින් ඇගේ නරක චරිතය මතු කරනු ලැබූ අතර අපරාධ නඩුවකදී විත්තිකරුගේ නරක චරිතය අදාළ නොවන බව සාක්ෂි ආඥා පනතේ 54 වගන්තියේ දැක්වෙයි. එබැවින් පෝලින් ද ක්‍රෑස්ට පැනවූ මරණීය දණ්ඩනයට එරෙහි අභියාචනයේදී කීර්තිමත් රාජ නීතීඥයකු වූ ජී. ඊ. චිට්ටි පැවසුවේ ඇගේ නරක චරිතය පිළිබඳ සාක්ෂි ජූරි සභාවේ මනසට තදින් කාවදින්නට ඇති බවයි. ඊට ඔහු අපූරු උපමාවක් දැක්වීය. පෙරහන් කඩදාසියකට තීන්ත බිඳුවක් වැටී විසිරී ගිය පසු නැවත මැකිය නොහැකිය. ඇයටද වූයේ එවැන්නක් බව ඔහුගේ තර්කය විය. කෙසේ වෙතත් මහාධිකරණ නඩු විභාගයේදී විනිසුරුවරයා ජූරි සභාවට තදින් අවවාද කර තිබුණේ විත්තිකාරියගේ චරිතය පිළිබඳ සාක්ෂි නොසලකා හරින ලෙසයි. ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ විත්තිකාරියට එරෙහිව මිනීමැරීම සම්බන්ධව ප්‍රබල පරිවේෂණීය සාක්ෂි ගොන්නක් ලැබී ඇති බැවින් නරක චරිතය ගැන සාක්ෂි ඉදිරිපත් නොවූවද ඇය වරදකාරිය කිරීමට හැකි බවයි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය ජූරි සභාවේ තීන්දුව අනුමත කළේය.



පෝලින් ක්‍රෑස්

කිසිඳු ඇසු දුටු සාක්ෂියක් හෝ විද්‍යාත්මක සාක්ෂියක් නොමැතිව පරිවේෂණීය සාක්ෂි මත පමණක් පදනම්ව පෝලින් ද ක්‍රෑස්ට මරණ දඬුවම නියම විය. පසුව අග්‍රාණ්ඩුකාරවරයා ඇයගේ මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට වෙනස් කර තිබේ. යහපත් හැසිරීම මත 1980 දී ඇය නිදහස ලබා ඇත. ගාල්ලේ කන්‍යාරාමයක නිහඬ දිවියක් ගත කළ පෝලින් පසුව ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ බවට වාර්තා පවතී. අනතුරුව ඈ ගැන කිසිඳු තොරතුරක් නැත.

සැබැවින්ම පෝලින් ද ක්‍රෑස් ගෝඨාභය කිරඹකන්ද දරුවා ඝාතනය කළාද? නොඑසේනම් ඒ සඳහා වෙනකෙකුට සහාය වූවාද? නැතිනම් එම ඝාතනය කළේ වෙනත්ම අයෙකුද? එසේත් නැතිනම් දරුවාගේ මරණය සිදුවූයේ වෙනත් ක්‍රමයකින්ද? සාමාන්‍ය ව්‍යවහාරයට අනුව එය දන්නේ උඩ ඉන්න දෙයියෝ පමණි. එය ඝාතනයක් නම් ඝාතකයා ජීවිතය පුරා ඊට හෘද සාක්ෂියේ දඬුවමට යටත් වන්නට ඇත. එහෙත් මේ සියල්ල අදටත් නොවිසඳුණ අබිරහසක් වැනිය.

■ නීතිඥ රජනිකා ලියනගේ









# මේ ගාමන්ට් එකට කෙනෙක් බඳවගන්නේ සම්පූර්ණයෙන්ම අන්ධයි නම් විතරයි

## ඒක තමයි අපි බලන එකම සුදුසුකම

**ඩිලේකා මනෝරි වික්‍රමනායක**

හෙලන් කෙලර් තමයි ඇමෙරිකාවේ කලා උපාධියක් අරගත් පළවැනි අන්ධ කාන්තාව. පසුකලෙක හෙලන් සමස්ත ලෝකවාසී කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටපු සමාජ සේවිකාවක්, දේශපාලන ක්‍රියාකාරිනියක් වගේම ප්‍රකට ලේඛිකාවක් බවටත් පත්වුණා. ඒ වගේම අන්ධ අය ගැන කතාකරද්දී ප්‍රංශ ජාතික ලුවිස් බ්‍රේල් ගැනත් නොකියා බෑ. ඔහු කුඩා කාලයේදි හදිසි අනතුරකින් දෑස අන්ධ වුණු කෙනෙක්. නමුත් ලුවිස් ඔහු වැනි අන්ධ පුද්ගලයින්ට කියවීමට ලිවීමට එක්තරා ක්‍රමවේදයක් හොයාගත්තා. ඒ තමයි බ්‍රේල් ක්‍රමය. අදටත් දෘෂ්‍යාබාධිත මිනිස්සු ලියන්නේ කියවන්නේ ඔහු හොයාගත් ඒ බ්‍රේල් ක්‍රමයට පිංසිද්ධවෙන්න.

අන්ධ වුණත් ඇස් පෙනෙන මිනිස්සුන්ටත් ලේසියකට කරන්න බැරිවුණු හපන්කම් කරපු මිනිස්සුන්ගෙන් අපි මේ කතාව පටන්ගත්තේ එක හේතුවක් උඩ. ඒ මේ කතාවෙන් අපි කියන්නෙත් දෑස් නොපෙනෙන මිනිස්සුන්ගේ ලොකු හපන්කමක් ගැන හින්දා. මේ කතාව අපිට ආරංචි වුණේ අනුරාධපුර, කහටගස්දිගිලිය පැත්තෙන්. අනුරාධපුර කියපු ගමන් පරණ වෙහෙර විහාර මතක් වුණාට මේ කියන්න යන්නේ නම් පුංචි ගාමන්ට් එකක් ගැන. ගාමන්ට් එකේ නම තමයි ‘නේත්‍රාංජලී ඇපරල්’. මෙතැන වැඩ කරන්නේ දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන් විතරයි. ඔවුන් ගැන තමයි මේ කතාව.

**“මං තමයි නේත්‍රාංජලී ඇපරල් ගාමන්ට් එක කරන්නේ. මේ ගාමන්ට් එකට කෙනෙක් බඳවගන්නේ එයා සම්පූර්ණයෙන්ම අන්ධයි නම් විතරයි. ඒක තමයි අපි බලන එකම සුදුසුකම වෙන්නේ. මේ වෙනකොට ඒ වගේ තරුණ තරුණියෝ හත්දෙනෙක් මෙතැන වැඩ කරනවා. ඒ එක්කම තව විසිඅටදෙනෙක් මෙතැන වැඩට එන්න අහලා මට කතා කරලා තියෙනවා.”**

ඒ විදියට අපිත් එක්ක කතාබහට මුලපිරුවේ ඩිලේකා මනෝරි වික්‍රමනායක. 51 හැවිරිදි ඩිලේකා තමයි නේත්‍රාංජලී ඇපරල් ගාමන්ට් එකේ හිමිකාරිනිය. හැබැයි දැන් නම් ඇගේ වැඩිමල් දියණිය වෙන 24 හැවිරිදි මිෂෙල් කුලසේකරත් තවත් කාන්තාවකුත් ඇයගේ සහායට ඉන්න බවයි ඩිලේකා අපිට කිව්වේ.

“මේ ගාමන්ට් එක පටන්ගත්තේ පහුගිය අවුරුද්දේ මාර්තු 31 වැනිදා. මේ මාර්තු 31 වැනිදට හරියටම අවුරුද්දයි. මුලදි නම් ගොඩක් අභියෝග ආවා. මොකද මේ කවුරුත් මෙතැනට එද්දි මහන්න දැනගෙන හිටියේ නෑ. ඉතින් එහෙම පිරිසකට මහන්න උගන්වනවා කියන එක සෙල්ලමක් නෙවෙයි. ඔන්න ඇස් පෙනුණා නම් ඇඟිල්ලෙන් ඇනලා හරි කියලා දෙන්න තිබුණා. ඒත් පොඩ්ඩක්වත් පේන්නේ නැති අයට මහන්න උගන්වන එක හරිම අමාරු වැඩක් වුණා.”

වැඩේ අමාරු වුණත් ඩිලේකාගේ ගෝලයෝ ටික ලස්සනට වැඩේ අල්ලගෙන කියලා අපිට හිතුණේ ඔවුන් මහන හැටි දැකලා. දන්නවද ඔවුන් මහන්නේ හයිස්පීඩ් ජුකී මැෂින්වලින්. ඒකෙන්ම පැහැදිලියිනේ දෑස් නොපෙනුණත් ඔවුන්ගේ මැහිල්ලේ තරම කොහොමද කියලා. ඉතින් ඒ මැහිල්ල දිහා බලාගෙනම අපි ඩිලේකාගෙන් ඇහුවේ දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන් වෙනුවෙන් මෙහෙම ගාමන්ට් එකක් පටන්ගන්න හේතුව.

“ඒක ටිකක් දිග කතාවක්. මං ඉස්කෝලේ ගිහින් ඉවරවුණු ගමන් මහන්න පුරුදුවුණා. මගේ වෙඩින් එකට ඇඳපු මංගල ගවුම මහගත්තෙත් මමයි. ඉතින් මහන්න පුරුදුවෙලා මංගල ඇඳුම් ව්‍යාපාරයක් පටන්ගත්තා. ඔය අතරේ මගේ අම්මා නැතිවුණා. ඒත් එක්කම මං මානසිකව වැටුණා. මට අම්මා වෙනුවෙන් දෙයක් කරන්න ඕන වුණා. එහෙම හිතලා කර කර හිටපු රැකියාව නතරකරලා පොඩ්ඩියකට දෘෂ්‍යාබාධිත ළමයි ඉන්න තැනක වැඩට ගියා. එතැනදි මං ඒ ළමයින්ට මහන්න උගන්වන්න පටන්ගත්තා. එතැන කාලයක් ඉඳලා ඇවිත් තමයි මගේ ගෙදර මෙහෙම ගාමන්ට් එකක් පටන්ගත්තේ. මොකද කලින් තැනින් මං අයින් වෙනකොට එතැන හිටපු දරුවෝ ඉල්ලීමක් කළා. ඒ අනාගතයේ ඉපදෙන්න ඉන්න අන්ධ දරුවෝ ගැන හිතලා මේ වැඩේ දිගටම කරන්න කියලා.”



ඩිලේකා කියන විදියට ඇය තමයි ලංකාවේ පළමුවතාවට දෘෂ්‍යාබාධිත ළමයින් වෙනුවෙන් විධිමත් මැහුම් ක්‍රමයක් වගේම වර්ණ හඳුනාගැනීමේ ක්‍රමයක් හොයාගෙන තියෙන්නේ. මොකද ඇය කියන විදියට මෙතරම් කාලයක් පුරාවට ඒ දේවල් වෙලා තියෙන්නේ අවිධිමත් ක්‍රමයකට. දිනක් ඇය උගන්වන අතරේ සිදුවූ සංවේදී සිදුවීමක් ගැනත් ඩිලේකා මේ විදියට අපිට කිව්වා.

“දවසක් අපිට රෝස පාට රෙද්දක් ආවා. මං කිව්වා ළමයින්ට ළමයි රෝස පාට ලස්සන රෙද්දක් ඇවිත් තියෙනවා එන්න පෙන්නන්න කියලා. ළමයි දුවගෙන ආවා. දැන් කාටවත් රෝස පාට පේන්නේ නෑනේ. එතැන ගොඩක් අය ඉන්නේ උපතින් පෙනිලා පස්සේ පෙනීම නැතිවුණු අය. මං කිව්වා ඔයාලා පොඩි කාලේ කාපු සීනිබෝල මතක් කරගන්නකෝ. ඒ පාට තමයි මේ රෙද්දත් කියලා. ඒ වෙලාවේ එක ගෑනු ළමයෙක් දුකෙන් වගේ ගිහින් එයාගේ මැෂින් එක ගාව වාඩිවුණා. වෙනදට එයා එහෙම නෑ. පස්සේ මං ඒ ළමයා ගාවට ගිහින් ඔලුව අතගාන ගමන් ඇයි පුතේ ඇහුවා. පස්සේ එයා කිව්වා ‘මිස් මං සීනිබෝල දැකලත් නෑ’ කියලා. ඒක මතක් වෙනකොට අදටත් මගේ ඇස් දෙක තෙත්වෙනවා.”

කිව්වත් වගේ ඩිලේකා අදටත් ඒ සිදුවීම මතක් කරන්නේ සෑහෙන්න සංවේදී වෙලා. ඉතින් නොදැනුවත්වම සංවේදී ඉසව්වකට ගලාගෙන ගිය කතාබහ වෙනස් කිරීමේ අරමුණු ඇතුව අපි ඇයට මෙහෙම ප්‍රශ්නයක් යොමුකළා. ඒ නේත්‍රාංජලී වැඩබිමට දෘෂ්‍යාබාධිත ළමයින්ම ගන්න හේතුව.

“අන්ධ අයට කොහෙවත් ජොබ් දෙන්නේ නෑ. හැමෝම හිතන්නේ අන්ධ අයට මුකුත් බෑ කියලා. මං කරන වැඩෙන් මට සමාජයට කියන්න ඕනවුණේ අන්ධ බව කියන්නේ ඒ අයගේ ඇති නොහැකියාව නෙවෙයි කියලයි. මේ වෙනකොට අපේ ගාමන්ට් එකේ පොඩි දරුවන්ගේ ඉඳන් වැඩිහිටියා දක්වාම හැම ඇඳුමක්ම මහනවා. ඕනෑම විලාසිතාවක් මේ අයට පුළුවන්. ඊට අමතරව බෑග් වගේ විසිතුරු භාණ්ඩත් මහනවා. ඒ හැමදේකම ප්‍රමිතිය 100 %යි. ඔන්ලයින් හරහා තමයි ව්‍යාපාරය සිදුකරන්නේ. අපේ නිෂ්පාදනවලට ලොකු ඉල්ලුමක් මේ වෙනකොට තියෙනවා.”

ඔය අතරවාරයේ ඩිලේකා කරන හරි ආදර්ශවත් වැඩක් ගැනත් අපිට දැනගන්න ලැබුණා.

**“මේ වෙනකොට ප්ලාස්ටික්වලින් සොබාදහමට ලොකු තර්ජනයක් එල්ලවෙලා තියෙනවා. ඉතින් අපි ඇඳුම්වලට ලීවලින් හදපු බොත්තම් දන්නේ. ඒත් එක්කම මිනිස්සු කැලෑ කපන්න පුරුදුවෙලා තියෙනවා. ඒක නිසා අපි බෑග් මහද්දි ඒකට මී ඇටයක් හෝ ඉගිනි ඇටයක් දලා මහන්නේ. එතකොට කවදා හරි බෑග් එක පාවිච්චියෙන් බැහැර කරාට පස්සේ බෑග්**






**ඒ වෙලාවේ එක ගැනු ළමයෙක් දුකෙන් වගේ ගිහින් එයාගේ මැෂින් එක ගාව වාඩිවුණා. වෙනදට එයා එහෙම නෑ. පස්සේ මං ඒ ළමයා ගාවට ගිහින් ඔලුව අතගාන ගමන් ඇයි පුතේ ඇහුවා. පස්සේ එයා කිව්වා 'මිස් මං සීනිබෝල දැකලත් නෑ' කියලා**

**එක මහපු රෙද්ද විනාශ වෙලා අර ඇටේ පැළවෙනවනේ."**

නේත්‍රාංජලී ඇපරල් ගාමන්ට් එකේ වැඩකරන තරුණ තරුණියන්ට ඩිලේකා හොඳ මාසික වැටුපකුත් ගෙවනවලු. ඒ විතරක් නෙවෙයි දවල්ට කෑමබීම ටිකත් දෙනවලු. සතිඅග නිවාඩුත් දෙනවලු. මේ අතරේ දැන් ඇගේ ආසාව ඇගේ ඉඩමක නේවාසිකාගාරයක් හදලා තව තවත් දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන්ට ඩිලේකා ගාව රැකියා දෙන්නලු. ඒත් ඒ වෙනුවෙන් නම් කාගේ හරි උදව්වක් උවමනා වෙනවා කියලයි ඇය 'ධරණී'ට කිව්වේ.

"නේවාසිකාගාරයක් හදන එක ලොකු වැඩක්. ඒක මට තනියම කරන්න බෑ. ගාමන්ට් එක කරන්න නම් පස්සරමුල්ලේ දයාවංශ හිමි වගේ අනුර වික්‍රමනායක, මුරලිදරන්, රාජේන්ද්‍රන් කියන මහත්වරු උදව් කළා. කොළඹ 306 B2 සිංහ සමාජයෙනුත් ගොඩාක් උදව් ලැබුණා. ඒ වගේම සැමියාත් මතක් නොකර බෑ."

දරු දෙදෙනෙකුගේ මවක් වෙන ඩිලේකා මේ වෙනකොට තමන්ගේ ජීවිතේම කැපකරලා තියෙන්නේ දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන්ගේ අනාගතය වෙනුවෙන්. ගම මාතර වුණත් විවාහයෙන් පස්සේ මේ වෙනකොට ඇය පදිංචි සැමියගේ ගම වෙන අනුරාධපුරේ කහටගස්දිගිලියේ.

**"පුංචි කාලේ ඉඳන් මං හීන දැක්කේ ගත්කතුවරියක් වෙන්න. ඒත් මහන්න පටන්ගත්තට පස්සේ ඒ හීනය ටිකක් දුරස් වුණා. ඒත් ළඟදීම 'මගේ කවි සිත' කියලා කවිපොතක් එළිදක්වනවා. හැබැයි මොන දේ කළත් මොන අභියෝග ආවත් දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන් වෙනුවෙන් ආරම්භ කරපු නේත්‍රාංජලී ඇපරල් ගාමන්ට් එක නම් නතර කරන්නේ නෑ."**

ඩිලේකා එහෙම කිව්වේ තමන් යටතේ වැඩකරන දෘෂ්‍යාබාධිත තරුණ තරුණියන් දිහා බලාගෙන. 'ධරණී' අපි හිතන විදියට ඩිලේකා කියන්නේ රටේ අගයන්න ඕනේ කාන්තාවක්. මොකද ඇය මේ දෑස් නොපෙනෙන මිනිසුන්ට දෑස් පෙනෙන මිනිසුන් සේ ජීවත්වෙන්න උවමනා කරන මග සකසන්නේ ඔවුන් සියල්ලෝම ඇයගේ කුසින් වැදුවා හා සමානව සලකමින්. ඩිලේකා ළඟ තියෙන අන්න ඒ ගුණය නිසාම ජීවිතයේ වැඩි කාලයක් මුළුල්ලේ අන්ධකාරයට හුරුවෙලා හිටපු තරුණ තරුණියෝ දැන් හරි අපූරුවට ආලෝකය දකිනවා. ඉතින් දෑස නොපෙනුණත් ඒ අහිංසක කොල්ලන්ට කෙල්ලන්ට ඇත්තටම දැන් වැඩිය පාඩු නෑ.

**■ රුවන් එස්.සෙනවිරත්න**






# ඉන්දි රාජාගේ මොළේ නිසා දොස්තරලා කැලේ



තොරතුරු
පශු වෛද්‍ය
**තරිඳු විජේකෝන්**
(ශ්‍රී දළදා මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)

'ඉන්දි රාජා' ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තියේ අභිමානයට ප්‍රධාන හේතුවකි. බොහෝදෙනෙකුගේ අවධානය දිනාගැනීමට ඉන්දි රාජා සතු ආඩම්බරකාරකම මෙන්ම දඩබ්බරකමද හේතු වනවා ඇත. උන්දෑ කළ වැඩවලට දඬුවම් නියම වූයේ නම් මේ වනවිටත් ජීවිතාන්තය දක්වා හිරේට නියම වී තිබිය යුතු බව කිසිවකු ලියා තිබිණ. ඒ තරම් නාහෙට නාහන ගති ඇති මේ සුන්දර හස්තියා පශු වෛද්‍ය තරිඳු විජේකෝන්ගේද මනාප ලැයිස්තුවේ ඉහළින්ම සිටී. වර්තමානයේ වෛද්‍ය තරිඳු විජේකෝන් ඉන්දි රාජා සමඟ ඉතා සමීපව කටයුතු කරයි. හෙතෙම තරුණ වෛද්‍යවරයකු ලෙස කටයුතු ආරම්භ කළ කාලයේ වගේම සහාය ආචාර්යවරයකු ලෙස විශ්වවිද්‍යාලයට සම්බන්ධ වී සිටියදී පවා ඉන්දි රාජා ඔහුගේ ප්‍රධාන මාතෘකාවකි. ඉන්දිගේ කෙරුවාවල් ඒ තරම් රසවත්ය.

මෙරටට පැමිණි පළමු දිනයේ සිටම ඉන්දි රාජාගේ වතගොත හොඳ හැටි දන්නා මහාචාර්ය අශෝක දංගොල්ල වෛද්‍ය තරිඳුගේ ගුරුවරයායි. ඉන්දි රාජාට ඒ ගුරා සමඟ ඇත්තේ තදබල නෝක්කාඩුවකි. ඊට ප්‍රධාන හේතුව වදෙන් පොරෙන් කළ ප්‍රතිකාර කිරීම්ය. එහි ඊළඟ පුරුක පශු වෛද්‍ය තරිඳුය. තමා කෙරෙහි ඉන්දි රාජාගේ සිත බිඳුවා ගැනීමට බෙහෙත් වඩියක් දීම හොඳටම ප්‍රමාණවත් වේ. මොන දේ වුවද අවශ්‍ය ප්‍රතිකාර ලබා දිය යුතුමය. වසර ගණනකට පෙර දිනක් මහාචාර්ය දංගොල්ල වෛද්‍ය තරිඳුට ඇමතුමක් දුන්නේය.

**"තරිඳු, අද ඔයා කොහොමහරි ඉන්දි රාජාට පණු බෙහෙත් දෙන්න ඕනෙ."**

කොහොමහරි ඉන්දි රාජාට බෙහෙත් පෙවීමේ රඟේ වෛද්‍ය තරිඳු හොඳටෝම දනී. ඒ, ඊට පෙර ලැබූ අත්දැකීම් අනුවය. ඒ පැටිකිරිය කොයිතරම් දන්නවා වුවද පණු බෙහෙත් පොවා ගැනීම අනිවාර්යය වේ. ඉන්දි රාජාට ලබාදෙන්නේ සාමාන්‍ය පණු බෙහෙත් නොවේ. විශේෂිත වර්ගයකි. එකල ඔහුට තිබූ යම් අසනීප තත්ත්වයක් හේතුවෙන් එම පියවර ගෙන තිබිණ. ඖෂධ සූදානම් කරගත් වෛද්‍ය තරිඳු ඒවා ලබාදෙන ආකාරය කල්පනා කළේය.

කැලණිය රජමහා විහාරයේ මහ පෙරහර පැවැත්වීමට තිබුණේ එදිනයි. කරඬුව වැඩම කරවීමේ භාරදූර කාර්යය පැවරී තිබුණේ ඉන්දි රාජාටය. ඒ අනුව සැලසුම සකස් කෙරිණ. ඉන්දි රාජා පෙරහර ගමන අරඹන විටම පශු වෛද්‍ය තරිඳු ඇතුළු පිරිස කටයුතු ආරම්භ කළහ. වෛද්‍ය තරිඳු විශාල කෝලිකුට්ටු ඇවරි තුනක් මිලට ගෙන තිබිණ. හෙතෙම ඒවා සිය සහායකට ලබා දී අවශ්‍ය උපදෙස් දුන්නේය.

**"එක ඇවරියක ගෙඩි මැදින් පලන්න. ඊටපස්සෙ පණු බේත් ඇතුළට දලා කෝකටත් කෙසෙල් ගෙඩි වටේට පොල් පැණි ගාන්න."**

කෙසෙල් දෙන මුවාවෙන් පණු බෙහෙත් දීමේ සැලැස්මේ මූලික අදියර සාර්ථකය. දැන් ඒවා ඉන්දි රාජාට ලබාදීමට සුදුසු වේලාව එනතුරු බලා සිටිය යුතුය. පැය දෙකහමාරක තුනක පමණ පෙරහර ගමනින් පසු ඉන්දි රාජා නැවත පැමිණියේ විඩාබරවයි. කරඬුව ඉවත් කිරීමට තුන් හතරදෙනෙක් ඉන්දි රාජාගේ පිටට නැගුණහ. එවිට හස්තියාගේ අවධානය තිබුණේ ඒ වෙතය. හස්තිපාලකවරයා හිස වනා පැවසුවේ **"දැන් හොඳම වෙලාව" බවයි. එතැනට පැමිණි දයක මහතෙකු වෙත කෙසෙල් ඇවරි ලබා දී තිබිණ. ඔහු මේ කුමන්ත්‍රණයේ අගක් මුලක් නොදනී. හෙතෙම වෙහෙසට පත් හස්තියාට ගෞරවයෙන් යුතුව කෙසෙල් ඇවරි තුනම ලබා දුන්නේය. ඉන්දි රාජා රැවැට්ටීම ගැන පශු වෛද්‍ය තරිඳු සහ හස්තිපාලකවරයා පසුවූයේ දැඩි ප්‍රීතියෙනි. ඉන්දිට පණු බෙහෙත් පෙවීමේ මෙහෙයුම අතිසාර්ථකය. නමුත් පශු වෛද්‍ය තරිඳුට එම සතුට භුක්ති විඳීමට ලැබුණේ විනාඩි තුනක පමණ කාලයකි. කෙසෙල් ඇවරි දෙකක් කෑ ඉන්දි රාජා අනෙක් ඇවරිය ගණනක් නැතිව බිම දැමීය. ඒ, බෙහෙත් එබ්බවූ කෙසෙල් ඇවරියයි. එතැනින් නොනැවතුන ඉන්දි රාජාගෙන් පශු වෛද්‍ය තරිඳු දෙස නොරුස්නා බැල්මකි. "ආවා මෙතන මාව අන්දන්න"** වැනි අදහසක් එහි තිබිණ. එවරද ඉන්දි රාජා හමුවේ පශු වෛද්‍ය තරිඳු සහ සෙස්සෝ පරාජයට පත්වූහ.

**■ රජනිකා ලියනගේ**

රත්තරන් දුවේ



අත්තනායක
එම්. හේරත්



# කොච්චර ලොක්කියෙක් වුණත් අයියා හොයලා දෙන කෙනෙක්වයි මම බඳින්නේ

රත්තරන් දුවේ

මේ කියන්න යන දැරිය මට මුණගැහුණේ පොල්ගහමුල අධ්‍යාපන ආයතනයේදී. ඇය පංතියේ පිරිමි ළමුන්ගේ දැඩි ආකර්ෂණයට ලක්වුණු දුවක්. පංතියේ විෂය පරිබාහිර ක්‍රියාකාරකම්වල මේ දුව නොහිටියානම් ඒක ලොකු පුදුමයක්. ඉතින් මේ දුවට ඉගෙනගන්නත් ලොකු උනන්දුවක් තිබුණා. පංතියේ පිරිමි ළමයි එයාගේ පස්සෙන් එනකොට එයා එක්කෝ ඒක විදුහල්පතිතුමාට කියනවා, නැත්නම් මට කියනවා. ඉතින් දවසක් මම කිව්ව "දුව ඔයා වැඩිහිටියෙක්. උපාධි පංතියෙන් පිරිමි ළමයෙක් හොයාගත්තොත් ඔයාට එක සමාන කල්පනා ඇති කෙනෙක් ලැබෙයි" කියලා. ඒ දුව කිව්වා "අපේ අම්මා ජීවතුන් අතර නෑ, තාත්තත් නෑ. අයියා තමයි මාව බලාගන්නේ. මම මොන උපාධිය කරත් මම බඳින්නෙ අයියා කැමති වෙන කෙනෙක්. එයා මොන රස්සාව කළත් මං අයියගෙ අණට යටත්" කියලා.  මං ඒ දුවට ඒ අදහස කිව්වා මිසක් ඒ ගැන බල කර කර කියන්න ගියේ නැහැ.

ඕනෑම දරුවෙක්ගේ ඉරණම විසඳෙන්නේ ඒ දරුවගෙ කැමැත්තට. ඒ හින්දා මං ඒකට ඉඩ දීලා හිටියා. කාලය මෙහෙම ගෙව්ලා ගියා. ඊටපස්සේ මේ දුව ගැන එක්තරා ගුරුවරයෙක් උනන්දු වුණා. ඒ ගුරුතුමා පංතියට ආවේ බස් එකක. එතුමා උගන්වපු විෂය මේ දුව ඉගෙනගත්තෙත් නැහැ. ඒ වගේම මේ ගුරුතුමා විවාහක කෙනෙක්. මම ඒක ඒ දුවට කිව්වා. ඊටපස්සේ ඒ ගුරුවරයා මගඇරලා ගෙදර යන්න මේ දුවට ගොඩක් මහන්සි වෙන්න වුණා. ඒ දුව කළේ ඒ ගුරුවරයා යනකල් පංතියට වෙලා ඉන්න එක.

දවසක් මම දුවට කියලා දුන්නා සද්ධර්මරත්නාවලියේ 'උග්ගසේන සිටු පුත්‍රයාගේ කතාව'. පංතියේ ළමයි හැමෝම ඒ කතාව අහගෙන හිටියා. එක්තරා විජ්ජත් කුලයක නැටුම් ගැයුම් සර්කස් දන්න දුවෙක් හිටියා. එයා හරිම ලස්සනයි. ඉතින් ඔය සර්කස් බලන්න උග්ගසේන සිටු පුත්‍රයත් ආවා. ඇය ඉහළ ආකාසේ දිග රිටක නැගිලා කරන සර්කස් දැක්කම උග්ගසේනට ආසා හිතුණා ඇගේ රූපයට.

**'පාරට අද්දර දෙල් ගස මුදුනේ දෙල් නෙළනා ළඳ මට පෙනෙනා'**

කියන ජන කවිය මතක් කරලා මං කිව්වා ස්ත්‍රියක තම ස්ත්‍රී චමත්කාරය ඒ විදියට පෙන්වනකොට පිරිමි තුළ ශෘංගාරය උපදිනවා. ඉතින් උග්ගසේනට ආවෙත් ඒ දර්ශන ශෘංගාරය. ඉතින් එයා ගෙදර ගිහිල්ලා නොකා නොබී වැතිරිලා හිටියා. අම්මා තාත්තා ඇහුවම එයා කිව්වා අර විජ්ජත් කුල කාන්තාව මට ඕන. සිටුවරු මේ වගේ කසාදවලට කැමති නැහැනේ. දෙමාපියෝ විරුද්ධ වුණා. ඒත් උග්ගසේන නොකා නොබී ඉන්නකොට දෙගොල්ලම එකතුවෙලා දෙන්නව බන්දලා දුන්නා.

තමන් බැන්ද මිනිහට සිටු තනතුර හැර වෙන කිසිම රස්සාවක් නැහැ. විජ්ජත් කාන්තාවට බබෙක් හම්බවුණා. එයා දරුවා නලවන්නේ,

**'මොකක්වත් බැරි එකාගේ බබා නැලවියන්**
**කරත්ත දක්කන්න පුළුවන් එකාගෙ බබා නැලවියන්'**

කිය කියා. තරුණයාට ලැජ්ජා හිතුණා. තම සිටු තනතුර අතහැරිය ඔහු බිරිඳ මරන්න හැදුවේ නැහැ. බිරිඳට ගැහුවෙත් නැහැ. එයා තමන්ගේ මාමණ්ඩිට කියලා බිරිඳ දන්න සර්කස් සාත්තරය ඉගෙනගෙන අන්තිමට තම බිරිඳටත් වඩා දක්ෂ සර්කස්කාරයෙක් වුණා. උග්ගසේනගේ සර්කස් බලන්න බුදු හාමුදුරුවොත් වැඩියා.

මම මේ කතාව කිව්වම අර දුව මට කියනවා "මාත් සර් අයියා හොයලා දෙන කෙනෙක්ව බඳිනවා. ඊටපස්සේ එයාට පුංචි පුංචි අභියෝග කරලා මං එයාව මටත් වඩා හොඳ තැනකට ගේනවා" කියලා. මං ඉතින් ඒකට ආශිර්වාද කළා. ඉතින් මේ දුව උපාධිය සමත් වුණා. අයියා හොයලා දුන්නේ උපාධියක් නැති තරුණයෙක්ව. දැන් ඇය ගුරුවරියක් විදියට වැඩ කරනවා. උපාධියක් නැති වුණාට එයා හොයාගත්තේ එයාට ආදරය කරන උතුම් මනුෂ්‍යයෙක්. මොකක්හරි එයාගේ වරදකට මේ දුව විරුද්ධ වුණොත් ඒ

**ඇත්තටම මම දැකලා තිබුණු හොඳම අඹුසැමි දෙන්නා මගේ අම්මයි තාත්තයි. මං ඊළඟට එහෙම අඹුසැමි යුවළක් දැක්කේ මේ උපාධිධාරී දුවගෙන්.**



පුතා ඒ වරද කිසිදක කරන්නේ නැහැ. ඇත්තටම මම දැකලා තිබුණු හොඳම අඹුසැමි දෙන්නා මගේ අම්මයි තාත්තයි. මං ඊළඟට එහෙම අඹුසැමි යුවළක් දැක්කේ මේ උපාධිධාරී දුවගෙන්.

මගේ අම්මාට මගේ තාත්තා සැලකුවේ රැජිනකට වගේ. මේ පුංචි උපාධිධාරිනියත් මගේ අම්මා වගේ තම සැමියාගේ වැරදිවලින් එයාව ගලවගත්ත කෙනෙක් වගේ වැඩ කරනවා. ඉතින් මගේ දුවේ පිරිමි හදාගන්න ඕන හොඳම ක්‍රමය ඒක කියලයි මට හිතෙන්නේ. එහෙම නැතුව සැමියාට අපහාස කිරීමෙන් හෝ තලා පෙලා දැමීමෙන් නෙවෙයි ඒක කරන්න ඕන. ඉතින් ඒ පාඩම දුව ඉගෙනගත්තේ සද්ධර්මරත්නාවලියෙන්. ඒ නිසා පුළුවන් විදියට ඔය අතීත කතා කියවලා බලන්න කියලා මං මේ දුවලගෙන් ඉල්ලනවා.

විවාහ වෙන්න ඕන පෙනුමට, වත්පොහොසත්කමට නෙවෙයි දුවේ. තමන්ගේ හිතට ගැළපෙන කෙනා එක්ක. මේ සිද්ධිය කියනකොට මට තව කතාවක් මතක් වුණා. දවසක් මං කැනඩාවට ගියාම එහේ කලා උළෙලක් තිබුණා සිංහල ළමයින්ට. අපේ පංතියේ දුවෙක් මගෙන් ඇහුවා "සර් අපට මොළ දෙකයි, අත් දෙකයි, පා දෙකයි, බඩවැල් දෙකයි, ඇස් දෙකයි, කන් දෙකයි, වකුගඩු දෙකයි, පෙනහලු දෙකයි තියෙනවා. ඇයි සර් අපට එක හෘදය වස්තුවක් තියෙන්නේ?" කියලා. ඒ දුවගේ උත්තරය තමයි එක හෘදය වස්තුවක් මවලා තියෙන්නේ ඒකට ගැළපෙන අනෙක් එක හොයාගන්න කියලලු. ඉතින් තමන්ගේ ඇතුළේ තියෙන හෘදය වස්තුවට සමාන හෘදය වස්තුව එළියේ කා ළඟ හරි තියෙනවා. සල්ලි බලාගෙන ගියොත්, ඉඩම් බලාගෙන ගියොත් සමහරවිට ඒක හම්බනොවෙන්න පුළුවන්. ඉතින් තමන්ට ගැළපෙන හෘදය වස්තුය ඇත්තෙ කා ළඟද කියලා විමසිල්ලෙන් හොයලා බලන්න. ඇත්තටම දුවේ 'හෘදය' කියන්නේ 'වස්තුවක්'. අපි අපේ ශරීරයේ වෙන කිසිම දේකට වස්තුව කියන්නේ නෑනේ. ඒ නිසා තමන් හොයාගන්න අනික් හෘදය වස්තුවත් තමන්ගේ හෘදය වස්තුව පරිස්සම් කරන්න පුළුවන් විදියේ එකක් වෙන්න ඕන.

අත්තනායක එම්. හේරත්




අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

මාසික අධ්‍යාපනික පුවත්පත් 6ක්

අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ

අවුරුදු උත්සවය වෙනුවෙන් සැකසූ පින්තූර කොළයක් සමඟ

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348

දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක




Steuart
අත්ගුණය

තාමත් හොයන්නේ අම්මාගේ කෑමවල රසමද?

කටට සැරට අපේ රසට හදන
ඔබේ රසවත් කෑම වේලට
සැබෑ අත්ගුණය මුසු කරන
ශ්‍රී ලාංකේය කුළුබඩු

හඳුන්වා දෙන අත්ගුණය කුළුබඩු

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

# ජීවිතේ විඳලා නැති මිනිස්සු එක්ක හැප්පිලා දිනන්න බෑ

තමන්ගේ මානසික සුවය ප්‍රමුඛතා ලැයිස්තුවේ උඩින්ම තියාගන්න කියලා මම කිව්වොත් ඒක ආත්මාර්ථකාමීකමක් වගේ ඔබට දැනෙන්න පුළුවන්. ඒත් තමන්ගේ මානසික සුවය පිරිහුණු කිසිම වෙලාවක තවත් කෙනෙක්ව සතුටින් තියන්න බැහැ කියන එක, මනස පිළිබඳ විශේෂඥවරියක් නොවුණත් මම වගකීමෙන් කියනවා. ඒ නිසා අම්මා කෙනෙක් විදියටත්, බිරිඳක් විදියටත් මම හැමවෙලේම මගේ මානසික සුවයට මුල්තැනක් දෙනවා. මොකද මම දන්නවා ඒකට පොඩි හරි හානියක් වුණොත් ඒකේ ලොකුම බලපෑම එල්ල වෙන්නේ මට වඩා මගේ පවුලේ සාමාජිකයන්ට කියලා. හිතේ සතුට රැකගෙන සැනසීමෙන් ඉන්න මං හැමවෙලේම උත්සාහ කරන්නේ ඒකයි.

ගෙදර වැඩපළ කරන අතරේ මං මගේ සතුට වෙනුවෙනුත් පුංචි පුංචි දේවල් කරනවා. මගේ අත්දැකීම් ලියනවා, ගෙදර කෑම හදන විදිය වීඩියෝ කරනවා, ඒවාගෙන් මම ලබන තෘප්තිය සාමාජමාධ්‍යවල මගේ මිතුරු මිතුරියන් එක්ක බෙදගන්නවා.

හැබැයි එහෙම වෙලාවල්වලදී, තරහා ගන්න හෝ ප්‍රතිචාර දක්වන්න කලින් අපි මතක් කරගන්න ඕන කාරණාවක් තියනවා. ඒ තමයි ඒ අයගේ ජීවිතවල අත්දැකීම් අපේ අත්දැකීම්වලට වඩා හාත්පසින්ම වෙනස් බව. සමහරවිට ඒ අයගේ ජීවිත හිඩැස්වලින්, කටුක අත්දැකීම්වලින් පිරුණු එකක් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ වගේ අය එක්ක හැප්පිලා, වාද කරලා දිනන්න බෑ කියන එක තේරුම්ගන්න ඕන. මගේ අත්දැකීම්වලින් මම තෙරුම්ගත්තු එකම දේ ඒකයි. ඒ අය එක්ක තර්ක විතර්ක කරන්න ගියොත් අපිට මුලින්ම නැතිවෙන්නේ අපේ මානසික නිදහස. ඒ නිසා අර කෙළ පිඬක් අහක දානවා වගේ එහෙම අයව වෛරයකින් තොරව හිතින් අතහැරලා හිතේ සැනසීම රැකගන්න එක වටිනවා.

ඔයා අම්මෙක්, දුවෙක් නැත්නම් බිරිඳක් වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් රැකියාවක නිරතවෙන වෘත්තිකයෙක් වෙන්න පුළුවන්. ඒ මොනම පසුබිමක වුණත් ගැටෙන්න

**ජීවිතේ ආශ්චර්යයක් වෙන්න ඕනයි කියලා හිතෙන හැමතැනකදීම ආදරය, කරුණාව දෙන්න**



**වරදක් නොකරම හිත රිද්දන මිනිස්සුන්ට අපේ ජීවිතේ අංශුමාත්‍ර ඉඩක්වත් දෙන්න ඕන නෑ**

එහෙම බෙදගනිද්දී ඒ දේවල්වල අඩුවක් පාඩුවක් හොයන්නම බලාගෙන ඉන්න අතලොස්සකුත් නැතුවම නෙවෙයි. එහෙම අයගෙන් ගල් මුල් වැදුණු වෙලාවක දහම් හරිම ලස්සන උපදේශයක් දුන්නු හැටි මට මතකයි...

"ඔය විවේචන දරාගන්න බැරිනම් ඔයා කරන දේවල් නතර කරන්න. හැමදේමක හොඳ වගේම නරක දකින මිනිස්සු ඉන්නවා. ඔයා කරන දේ ඔයාට හොඳ වුණාට තව කෙනෙක්ට ඒක නරක වෙන්න පුළුවන්. එහෙම වෙන්නේ ඒ මිනිස්සු ජීවිතේ ලබලා තියන අත්දැකීම් එක්ක. සෘණාත්මක දේවල් එක්ක පැටලෙන්න ගියාම ඔයත් ඒ ගොඩටම වැටිලා ඔයාගේ වටිනාකම නැති කරගන්නවා. ඔයා හැමවෙලේම කියනවනේ ඔය දේවල් කරන්නේ හිතේ සතුටට කියලා. ඉතින් ඒ සතුටට විතරක් අවධානය දීල අනිත් දේවල් මගාරින්න. අනවශ්‍ය දේට අවධානය දුන්නාම ඔයාට සතුට අමතක වෙනවා. එහෙම කරන්න බැරි නම් හොඳම දේ ඒවා නතර කරලා පාඩුවේ ඉන්න එක. ගැරහුම්වලට උත්තර නොදී ඒ අයට දිනන්න දෙන්න. මොකද, උත්තර දුන්නාම ආපස්සට ඔයාට ලැබෙන්නෙත් ඒවාමයි. ඔය දේවල්වලින් ඔයා ස්ට්‍රෙස් වුණාම ඔයාගේ හිතේ සතුට නැතිවෙනවා. ඊටපස්සේ ඔයාගේ මූණ වෙනස් වෙනවා. ඒක දරුවන්ට දැනෙනවා. ඒකට මං ආස නෑ. එයාලා එක්ක සතුටෙන් ඉන්න, මට වැදගත් එච්චරයි. ජීවිතේට ඇස් දෙකටවත් දැකලා නැති මිනිස්සු කියන දේවල් අපේ ජීවිත ඇතුළට ගේන්න එපා. කොටින්ම අපි දෙන්නාවත් ඒ ගැන කතා කරන්න කාලේ නාස්ති කරන එක අපරාධයක්. හිතේ සතුටට කරන දේවල් සතුටෙන් කරන්න. ඒක පීඩනයක්නම් දැන්ම නතර කරන්න"

සමාජමාධ්‍යවල විතරක් නෙවෙයි අපේ ජීවිතවලත් මෙහෙම පිරිස් ඉන්නවා. යාළුවෝ විදියට, නෑයෝ විදියට, අසල්වාසීන් විදියට වගේම පවුලේ සාමාජිකයන් විදියට පවා ඉන්න පුළුවන්. කරන කියන හැමදේ ගැනම වැරදි අඩුපාඩු හොයන, කියන්න දෙයක් නැත්තම් හදලා හරි කියන අය අපේ ජීවිතේ අපිට මුණගැහෙනවා.

එන කිසිම කෙනෙක් එක්ක ගැටෙන්න හෝ පැටලෙන්න යන්න එපා. මම අත්දකින විදියට තමන්ගේ මානසික නිදහස රැකගන්න පුළුවන් ලස්සනම ක්‍රමය ඒකයි. පහර දෙන අය, පහර දීලා ඇතිවුණු දවසක ඒක නතර කරාවි. එදාට ඒ අයට හිතාගන්න බැරි තැනකට ඇවිත් ඔයා ජීවිතේ විඳීවී.

මං තව පුංචි දෙයක් කියන්නම්. ඔයා දුකෙන් ඉන්න වෙලාවක වුණත් වචනෙකින් හරි තවකෙනෙක්ගේ මූණට හිනාවක් ගේන්න. පීඩාවකින් හිටියත් තවකෙනෙක්ගේ හිතට සැනසීමක් ලැබෙන දෙයක් කියන්න. ඒක පෙරලා ආපස්සට ලැබෙයි. මං හැමවෙලේම කියනවා වගේ සතුට බෙදන තරමට සතුට ලැබෙනවා.

ජීවිතේ ආශ්චර්යයක් වෙන්න ඕනයි කියලා හිතෙන හැම තැනකදීම, ආදරය දෙන්න... කරුණාව දෙන්න... එතකොට අපේ ජීවිතේ ආශ්චර්යවත් දේවල් සිද්ධවෙන එක නවත්තන්න කාටවත් බෑ.

■ හෂීණී මනමේන්ද්‍ර

**ඉතාලි ජාතික 'ලියනාඩා සියන්සියුලි' (LEONARDA CIANCIULLI) මිනිසුන් ඝාතනය කර ඒ මස් යොදාගෙන සබන් සහ කේක් ව්‍යාපාරයක් සිදුකළ කාන්තාවකි. මේ ඇගේ කතාවයි.**



# මිනී මස්වලින් කේක් හැදූ ඉතාලි නෝනා

## ලියනාඩා සියන්සියුලි

## LEONARDA CIANCIULLI

ලියනාඩාට තිබුණේ සුන්දර ළමා කාලයක් නොවේ. සම වයසේ දරු දැරියන්ගේ ජීවිතවල තිබූ සතුට මෙන් අංශුමාත්‍ර සතුටක් හෝ ඇයට තිබුණේ නැත. ඒ ඇගේ මවගේ නපුරුකම් හේතුවෙනි. දැරියට කෙතරම් නම් ජීවිතය තිත්ත වී තිබුණාද කිව්වොත් වරක් දෙවරක්ම ඇය සියදිවි හානිකරගන්නට පවා උත්සාහ කළාය.

"ලියනාඩා, මේ අහගනිං. උඹ යක්ෂයාගේ ශාපයට අහුවුණු එකියක්..."

ඒ පුංචි ලියනාඩාට විසිහතර පැයේ වැඩිපුරම ඇසුනු කතාවය. නපුරු ගතිගුණවලින් යුතු ඇගේ මව නිතර නිතර ඇයට බැණවැදුනේ එලෙසිනි. නමුත් තමාට එලෙසින් බැණවදින්නේ ඇයිදැයි ඇය කිසි දවසක මවගෙන් ඇසුවේ නැත. නිකමට හෝ එසේ ඇසුවා නම් බොහෝවිට ඇයට සිදුවන්නේ මැරුම් කන්නටය. එනිසා මවගේ නපුරුකම් ඉවසාගෙන සිටිනු විනා ඇයට වෙනත් විසඳුමක් නොවිණි.

කාලයත් සමඟ පුංචි ලියනාඩා රූමත් තරුණියක් ලෙසින් වර්ධනය විය. ඇගේ රූමත් බව නිසාමදෝ ඇයට පෙම් යෝජනාවලින්නම් අඩුවක් තිබුණේම නැත. ඒ අතරින් එක් තරුණයෙකුට ලියනාඩාගේ හිත ඇදී ගිය අතර ඒ වනවිට ඔහු කාර්යාලයක ලිපිකරුවෙක් ලෙස සේවය කරමින් සිටියේය. මවගේ අකමැත්තෙන් වුවද අවසානයේ ලියනාඩා ඔහු සමඟින් විවාහ විය.

කාලයත් සමඟ ඇය දරුවන් දහතක් බිහිකළාය. නමුත් අවසානවට මෙන් එයින් දහතුන්දෙනෙකුම අඩු වයසින් මියඇදුනි. නමුත් ජීවත්වෙන්නට වාසනාව ලැබුණු දරුවන් සිව්දෙනා ඇය ඉතා ආදරෙන් සෙනෙහසින් හදවඩා ගත්තාය. ඒ කෙසේවුවද තමාට ගෙවා දමන්නට සිදුවූ අතීතයත් දරුවන්ගේ අභිමිවීමත් නිසා ඇගේ මානසික මට්ටම එතරම් හොඳ මට්ටමක තිබුණේ නැත. ඒ නිසා ඇය නිතරම පාහේ ජීවත්වූයේ දැඩි කෝපයෙනි.

කාලය ගෙවීයද්දී ලියනාඩාට එක පිට එක ආ කරදරවලද නිමක් නැති විය. වරක් ඇයට සිර දඬුවම් පවා විඳින්නට සිදුවූවාය. ඒ ඇය සිදුකළ වංචා සහගත ක්‍රියාවක් සම්බන්ධයෙනි. තවත් වරෙක ඇය ජීවත්වූ නිවස දරුණු භූමිකම්පාවකින් විනාශ වී ගියේ උන්හිටිතැන් පවා නැති කරමිනි.

දවසින් දවස මෙලෙස තමාට පැමිණෙන කරදර ගැන කල්පනා කරද්දී ලියනාඩාට අගේ මව නිතර කියූ කතාව සිහිපත් විය. එනම් ඇය යක්ෂයාගේ ශාපයට හසුවූ එකියක් යන්නයි. එහි ඇත්ත නැත්ත දැනගැනීමට සිතූ ඈ අනාවැකි කියන කාන්තාවක් සොයාගෙන යන්නට තීරණය කළාය. එහිදී ඇයට අසන්නට ලැබුණේ ඇය දකුණු අතේ සිරගෙයද වම් අතේ අපරාධ සහ උම්මත්තකභාවයද සළකුණු කරගෙන ඉපදුණු තැනැත්තියක් බවයි.

මේ අතර තම පුතුන් සිව්දෙනා අතරින් ලියනාඩා වැඩිපුරම ආදරේ කළේ ඩිසේපිටයි. ඔහු එවකට ඉතාලි හමුදාවේ සේවය කරමින් සිටියේය. ඒ නිසාම ඇයට ඩිසේපිගේ ආරක්ෂාව ගැන විශාල බියක්ද හටගෙන තිබුණි. අනාවැකි කියූ කාන්තාව කී පරිදි තමා යක්ෂයාගේ ශාපයට ලක්වී ඇති නිසා තම පුතුටත් එයින් බලපෑමක් වනු ඇතැයි ඇය බියපත් විය. පසුව තම දරුවා එම ශාපයෙන් බේරාගැනීමට මිනිස් බිලි පූජාවක් සිදුකිරීමටයි ලියනාඩාට අවශ්‍ය වූයේ. එහි

**බේසමකට එකතු කරගත් මළසිරුරුවල තිබුණු ලේ කැටි ගැහෙනකල් මට බලාගෙන ඉන්න වුණා. ඊළඟට ඒවා කුඩුකරලා පිටි, සීනි, චොක්ලට්, කිරි සහ බිත්තර එකතු කරලා කේක් හැදුවා. ඒවත් මං දන්න කියන අයට කන්න බෙදුවා. ඒ විතරක් නෙවෙයි මගේ ළමයින්ට පවා මං ඒ කේක් කන්න දුන්නා**

ප්‍රතිඵලය ලෙස ඇය අතින් කාන්තාවන් තිදෙනෙකුම ඝාතනයට ලක්විය. ඒ වනවිට ලියනාඩාගේ වයස අවුරුදු හතළිස්තුනකි. කෙසේ හෝ එම සිදුවීමෙන් පසු දිගින් දිගටම මිනිසුන් මරා දැමීම ඇගේ ජීවිතයේ නිරන්තර කාරියක් බවට පත්විය.

ඔය අතරතුරයි ඇයට අලුත් අදහසක් පැමිණියේ. ඒ තමා අතින් ඝාතනය වන මිනිසුන්ගේ මිනී මස් යොදාගෙන සබන් සහ කේක් නිපදවීමටයි. පසුකලෙක එම ව්‍යාපාරය වෙනුවෙන් ඇය මිනිසුන් ඝාතනය කළ බව පැවසෙන්නේ වස පානය කිරීමට සැලැස්වීමෙනි. ඉන්පසු පොරවක් ආධාරයෙන් මළසිරුරු කැබලි කර කෝස්ටික් සෝඩා තුළ ගිල්වා දින කීපයක්ම තැම්බීමට හැරීමෙන් පසු කේක් සහ සබන් සාදා ඇත. ඒ සම්බන්ධව ඇයගේ දිනපොතක තිබූ සටහනක් මෙසේය.

'මැරී සිටින අයගේ සම සුදු පාටට හුරු මේදයෙන් සමන්විතයි. මම එය දිය කරගෙන ඊට සුවඳ විලවුන් බෝතලයක්ම එකතු කළා. ඊළඟට එය තවත් තම්බා ගත්තම සුවඳ සබන් නිර්මාණය කරගන්න හැකියාව ලැබුණා. මං ඒ සබන් දන්න කියන අයට තෑගි විදියට බෙදුවා.'







මේ අතර එකී දිනපොතේම තවත් පිටුවක ඇය මිනී මස්වලින් කේක් නිෂ්පාදනය කළ ආකාරය ගැන සටහන් කර තිබූ බව කියන්නේ මෙලෙසිනි.

'බේසමකට එකතු කරගත් මළසිරුරුවල තිබුණු ලේ කැටි ගැහෙනකල් මට බලාගෙන ඉන්න වුණා. ඊළඟට ඒවා කුඩුකරලා පිටි, සීනි, චොක්ලට්, කිරි සහ බිත්තර එකතු කරලා කේක් හැදුවා. ඒවත් මං දන්න කියන අයට කන්න බෙදුවා. ඒ විතරක් නෙවෙයි මගේ ළමයින්ට පවා මං ඒ කේක් කන්න දුන්නා.'

ලියනාඩාගේ මෙම ජුගුප්සාජනක ක්‍රියා කලාපය නිසා බොහෝ කාන්තාවන්ට ඇය අතින් මැරුම් කන්නට සිදුවිය. එසේ මැරුම් කා ඔවුන්ට සබන් කැල්ලක හෝ කේක් ගෙඩියකට අමුද්‍රව්‍යයක් බවට පත්වෙන්නට සිදුවිය. ඕනෑම අපරාධයක් දීර්ඝකාලීනව වසන් කිරීමට නොහැක. ඒ නිසා ලියනාඩාගේ මේ අපරාධය ගැනද එරට ආරක්ෂක අංශ වෙත තොරතුරු සැල විය. එහෙත් පොලිසිය ඉදිරියේ ඇය එම සියලු චෝදනා ප්‍රතික්ෂේප කළාය. අනතුරුව වැඩිමල් පුතු වන ඩිසේපිව පොලිසියට ගෙන්වා ප්‍රශ්න කිරීමට පොලිසිය තීරණය කළපසු ඇය සියල්ල පාපොච්චාරණය කළාය. එහිදී අනාවරණය වූ පරිදි ඇය මිනිසුන් ඝාතනය කිරීම පමණක් නොව මුදල් ඇතුළු ඔවුන්ගේ වටිනා දෑ පවා සොරාගන්නටද පෙළඹී ඇති බවයි. මේ සියල්ලටම හේතුවී තිබුණේ ඇයට තිබූ දරුණු මට්ටමේ මානසික ව්‍යාධියකි.

අවසානයේදී ඇයට මිනිස් ඝාතන සිදුකිරීමේ වරදට බරපතළ වැඩ සහිතව වසර තිහක් සිර දඬුවමකට යටත් කළ අතර ඊට පෙර වසර තුනක් ඇයට මානසික රෝහලක ප්‍රතිකාර ලබන්නට සිදුවිය. කෙසේ හෝ තිස්වසරක් පුරාවට සිරබත් කෑ ලියනාඩා 1970 ඔක්තෝබර් 15 වැනිදා රක්තාඝාතය නම් රෝගය වැළඳී මියගියාය. එසේ මියයන විට ඇයට වයස අවුරුදු 76කි. ඉතාලි ජාතික කාන්තාවක් වූ ලියනාඩා ඉපදී තිබුණේ 1894 අප්‍රේල් 18 වැනිදය.

මේ අතර අදටත් ඉතාලියේ රෝම නගරයේ අපරාධ විද්‍යා කෞතුකාගාරයේදී ඇය මිනිසුන් ඝාතනය කර මස් කැපීමට භාවිතා කළ පොරෝව ඇතුළු ආයුධ මෙන්ම එකී මස් තම්බා සබන් කිරීමට යොදගත් කල්දේරම දැකගත හැකිය. ලියනාඩා සියන්සියුලිගේ මේ බිහිසුණු කතාව අළලා මෑතකදී චිත්‍රපටයක්ද නිර්මාණය වූ අතර ඒ 'ලියනාඩා' (Leonarda) නම් ඉංග්‍රීසි චිත්‍රපටයයි.

■ රුවන් එස්.සෙනවිරත්න

# මේ තත්පරේ වැටුණත් ඊළඟ තත්පරේදී නැගිටින්න මට පුළුවන්

## රූප සුන්දරියක් වුණු කථිකාචාර්යවරිය තිළිණි කුමාරි

2021 අවුරුද්දේ තිබුණු 70 වෙනි ලෝක රූ රැජින තරඟයෙන් ජයග්‍රහණය කළේ පෝලන්ත තරුණියක්. ඇය තමයි ඒ වෙනකොට 22 හැවිරිදි වියේ පසුවුණු 'කැරොලිනා බිලව්ස්කා' (Karolina Bielawska). ඇය ඒ වෙනකොටත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හදාරමින් හිටපු සරසවි සිසුවියක්. ඒ විතරක් නෙවෙයි ඇය නිරූපිකාවක්, අභිප්‍රේරණ කථිකයෙක් වගේම රූපවාහිනී නිවේදිකාවක් බවත් පසුව දැනගන්න ලැබුණා.

එතැනින් ගියාම ඇමෙරිකාවේ ලාස්වෙගාස්වල තිබුණු 2022 ලෝක විවාහක රූ රැජින තරඟයේදිත් එවැනිම සිදුවීමක් වුණා. එවර එහි ජයග්‍රහණය ලබාගත්තේ ඉන්දියාවේ සර්ගම් කෞෂාල්. ඇයත් ඒ වෙනකොට ඉංග්‍රීසි සාහිත්‍යය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබූ පාසල් ගුරුවරියක්.




ලෝකයේම අවධානය දිනාගත් මේ රූප සුන්දරියන් දෙදෙනාගේ කතා අතරට පහුගිය දිනෙක තවත් එවැනිම කතාවක් එකතුවුණු හැටි අපි දැක්කා. ඒ 'ලෝක සංචාරක රූ රැජින' (Miss Tourism World Sri Lanka 2022) තරඟයේදී. ඒ තරඟය ජයග්‍රහණය කළේ මහනුවර පිළිමතලාවේ තිළිණි කුමාරි. බලාගෙන යද්දී ඇයත් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක්. ඉතින් ඒ සුන්දර කථිකාචාර්යවරියගේ රුවින් තමයි මෙවර 'ධරණී' කවරය හැඩවෙන්නේ.

**"ලෝක සංචාරක රූ රැජින තරඟය කියන්නේ අපේ රටේ ප්‍රධාන රූ රැජින තරඟයක්. 2022 තරඟයට අයැදුම් කරන්න කියලා දලා තියෙනවා මම දැක්කේ අහම්බෙන්. ඉතින් මටත් නිකමට වගේ අයැදුම් කරලා බලන්න හිතුණා.**

**අහම්බෙන් අයැදුම් කළාට මොකෝ අවසානෙදි 'ලෝක සංචාරක රූ රැජින' (Miss Tourism World Sri Lanka 2022) තරඟය ජයග්‍රහණය කළේ මම. ඒ වගේම තරඟාවලියේ Best National Costume, Best Miss Intelligent, Best Top Model වගේම Best Miss Popular කියන ජයග්‍රහණ ලබාගන්නත් මට පුළුවන් වුණා."**

තිළිණී ඇය ලබාගත් ජයග්‍රහණ ගැන කතා කළේ නිහතමානී ආඩම්බරකමකින්. මෙතුවක්කල් රූ රැජින කිරුළු ජයගත්තේ නිරූපිකාවන් නැත්නම් නිළියන්. කථිකාචාර්යවරියක් ලෝක සංචාරක රූ රැජින කිරුළ දරාගත්තු පළවැනි කතාව මේක. එහෙම බැලුවහම ඉතින් තිළිණීගේ ඒ ආඩම්බරය හරිම සාධාරණයි.

"මම උසස් පෙළ කළේ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයෙන්. පස්සේ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි වාග් විද්‍යා අංශයේ ශාස්ත්‍රපති පශ්චාත් උපාධිය අවසාන කළා. මේ වෙනකොට අධ්‍යාපන අංශයෙන් ආචාර්ය උපාධියත් හදාරනවා."



# මේ මගේ අසීමිත කැපවීමේ ප්‍රතිඵල මිසක මගේ වාසනාව නම් නෙමෙයි






මේ වෙනකොට ඇය විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක්. ඒ වගේම Esoft Metro සරසවියේ ශිෂ්‍ය සබඳතා පිළිබඳ කළමනාකාරවරිය විදියටත් කටයුතු කරනවා. තිළිණිගේ මේ අධ්‍යාපන පසුබිමයි වෘත්තියයි එක්ක රූ රැජින තරඟයක් ඇට ගැළපෙන්නේ නැති බව බොහෝදෙනෙක් තිළිණිට කිව්වලු. ඒත් තිළිණි නෙවෙයි ඒ කතා කනකට අරන් තියෙන්නේ. කැපකිරීම් දහසක් කරලා හරි තරඟය ජයග්‍රහණය කරනවා කියලයි ඒ කතා ඇහුවට පස්සේ ඇය තීරණය කරලා තියෙන්නේ.

**"කථිකාචාර්යවරියක් නිසා මේ වගේ තරඟ මට ගැළපෙන්නේ නෑ කියලා ගොඩක් අය කිව්වා. හැබැයි මම මාව විශ්වාස කළා. මම තරඟයට ගියේ ඒ විශ්වාසයෙන්. පෙර පුහුණුවීම් තිබුණු දට ලැප් එක දිග ඇරන් කැම්පස් එකේ වැඩ කර කර බස් එකේ කොළඹ ඉඳන් නුවර ගිහින් තියෙනවා. ඒ දවස් ටිකේ මට රැයක් දවාලක්, කන්න බොන්න වෙලාවක්වත් තිබුණේ නැහැ. වෘත්තීය ජීවිතය සමබර කරගෙන තරඟය දිනන්න මම ඒ තරමට මහන්සි වුණා."**

ඈ කරපු ඒ කැපකිරීම්වල ප්‍රතිඵල අද ඇයට ලැබිලා. තමන් ගැන ලොකු විශ්වාසයක් නැත්නම් ආසාවක් තිබ්බ පලියට මේ වගේ දේවල් කරන්න බැහැයි කියලත් ඔය අතරේ ඇය කිව්වා.

"දැන් මට 28යි. මම බලාපොරොත්තු වුණ ජයග්‍රහණ අද වෙනකොට මම ලබාගෙන ඉවරයි. ඉතින් මම ස්ථාවර ගැහැනියක් කියලා මට හිතෙනවා. මෙයා හරි වාසනාවන්ත තරුණියක් කියලා මගේ දිහා බැලුවහම කෙනෙක්ට හිතෙන්න පුළුවන්. හැබැයි මේ මගේ අසීමිත කැපවීමේ ප්‍රතිඵල මිසක මගේ වාසනාව නම් නෙමෙයි."

අධ්‍යාපනය, වෘත්තිය තුළින් වගේම තමන්ගේ ආශාවන් හැකියාවන් තුළිනුත් ඇය අද දුර ගමනක් ඇවිල්ලා. තවත් නොබෝ දවසකින් රංගන ශිල්පිනියක්, ගායන ශිල්පිනියක් විදියටත් අපට තිළිණිව දැකගන්න පුළුවන් වේවි.

**"මේ වෙනකොට සංගීත විශාරද උපාධිය හදරලා එහි දෙවැනි විභාගයට මුහුණ දෙන්න බලාපොරොත්තුව ඉන්නවා. ඒ වගේම අනුර විජේනායක මහත්මයාගේ අධ්‍යක්ෂණයෙන් රූපවාහිනියේ විකාශය වෙන්න තියෙන 'ආශා' ඒකාංගික ටෙලිනාට්‍යයේ ප්‍රධාන චරිතය සඳහාත් මම දායක වෙනවා."**

දැන් තිළිණිගේ එකම හීනය මහාචාර්ය කෙනෙක් වෙන එකලු. ඒත් එක්කම අධ්‍යාපන අංශය පැත්තෙන් ලොකු පෙරළියක් කරන්න ඇය මේ දවස්වල සැලසුම් කරනවලු. ඉතින් ඇගේ හීන ඒ විදියටම සඵල වේවායි කියමින් අපි ඇගෙන් සමුගත්තා. සමුගන්න කලින් 'ධරණී' කියවන ඔබ වෙනුවෙන් වචනයක් කියන්නත් ඈ අමතක කළේ නැහැ.

"ඉගෙනගෙන කැම්පස් ගිහින් ජොබ් එකක් කරලා පස්සේ විවාහ වෙලා කුස්සියට කොටුවෙන එක කාන්තාවකගේ භූමිකාව කියලා සමහරු හිතනවා. කිසිම කාන්තාවක් පිරිමියෙකුගෙන් යැපෙන තැනට වැටෙන්න හොඳ නැහැ. හැම තරුණියක්ම හොඳට ඉගෙනගෙන ආර්ථික වශයෙන් ශක්තිමත් වෙන්න ඕනේ. ඒ අතරවාරේ තමන්ගේ හැකියාවන් දක්ෂතාවලිනුත් ප්‍රයෝජනයක් ගන්න ඕනේ. ඒ දේ හරියටම කරපු නිසා මේ තත්පරේ වැටුණත් ඊළඟ තත්පරේදී මට නැගිටින්න පුළුවන්."

**■ රුවන් එස්.සෙනවිරත්න**

**ඡායාරූප - සමන් අබේසිරිවර්ධන**


**ඇඳුම් නිර්මාණය - UR Bridal Dresses**

**හැඩගැන්වීම - අමිල ගමගේ**

# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

118 කොටස



# මට ප්‍රශ්නයක් කතා කතාකරන්නවත් මගේ කියලා කෙනෙක් මේ රටේ නෑ

වෙනදට මිදුලේ නොදල්වන විදුලි පහන් සියල්ල කමල් දල්වා තිබුණි. ඒ නිසා පරිසරයේ වූ අඳුර මිදුලෙන් පැනගොස් තිබුණේය. සෙනුකා බලා සිටියේ ඈ ඇසූ ප්‍රශ්නයට තේනුක තෙන්නකෝන් උත්තරයක් දෙන තුරුය. ඒත් ඊට උත්තරයක් දෙන්නට තේනුක ඉක්මන් වුණේත් නැත.

**"මාත් මෙතන ඉන්නවා..."**

සෙනුකා තේනුකගේඋරහිස උඩින් අතක් බරට තැබුවාය. දුරට ගොස් තිබූ තේනුක තෙන්නකෝන්ගේ හිත ආයෙත් ආවේය.

**"මොකද්ද ඔයා ඇහුවේ..?"**

සෙනුකා ඇසූ ප්‍රශ්නය හොඳින්ම හිතේ තිබුණත් තේනුක තෙන්නකෝන් එය නෑසුන බවක් පෙන්වීය.

**"හා ඒ ප්‍රශ්නෙ මං පස්සෙ අහන්නම්... ඔයාට චතුමිණී ගැන මොකද හිතෙන්නේ?"**

තේනුකගේ ඇස් එළිය දිගේ අඳුරක් හොයාගෙන දිව්වේය. ඔහුට සෙනුකාගේ ප්‍රශ්නාවලියෙන් මගහරින්නට ඕනෑවුණේය. අම්මාත්, චතුමිණීත් එක්ව සෙනුකාගේ ඔලුවටත් මොකක් හෝ අදහසක් දමා ඇතැයි තේනුකගේ හිත සැක කළේය. ගේට්ටුව අයිනේ ලොකු පේර ගහේ අතු අස්සේ ඉතිරිවී ඇති කළුවර ළඟ ඔහුගේ ඇස් නැවතුණේය.

**"එයා ගැන මට විශේෂ දෙයක් හිතෙන්නෙ නෑ. පොඩි කාලේ අයියා කන මිරිකද්දි, ටොකු අනිද්දි පව් කියලා හිතුණට, දැන් එහෙමවත් හිතෙන්නෙ නෑ..."**

**"ඒ මොකද අර... මේ ඉන්නෙත් ඒ කෙල්ලම තමයි..."**

**"අපෝ නෑ... ඉස්සර අයියා කන මිරිකපුවම අර නිල් බෝල් ඇස්වලින් සට සට ගාලා වැටෙන කඳුළුයි දැන් ඇස්වලට පුරවන කඳුළුයි වෙනස්... හිතත් ඒ වගේ..."**

**"අනේ ඒ කෙල්ලට බොරුවට පද හදන්නෙ නැතුව ඉන්න. එයා දැන් හරි ලස්සනයි... පුදුමයි ඔයාගේ හිත නොගිය එක..."**

තේනුක තෙන්නකෝන් අඳුරේ නවතාගෙන සිටි දෑස් ආයෙත් එළියට ගෙනාවේය. ඔහු ඒ ඇස් ගෙනැවිත් නැවැත්තුවේ සෙනුකාගේ ඇස් ඉස්සරහය.

**"අක්කා, ඔයා දන්නවනෙ මගෙ හිත ආවට ගියාට තැන් තැන්වල නවතින්නෙ නෑ කියලා..."**

**"ඒක මං දන්නවා... ඒත් මට හිතිච්ච දේ කිව්වෙ. අනික ඉතින් චතුමිණී ඔයාට හැමපැත්තෙන්ම ගැළපෙනවා... රූපෙන්, දේපළවලින්, උගත්කමින්..."**

සෙනුකා කියවාගෙන යද්දී තේනුක තෙන්නකෝන් ඊට බාධා කළේය.

**"මොන දේ ගැළපුනත් මොකද, හිත ගැළපෙන්නෙ නැතුව..."**

**"ටිකක් කල් ආශ්‍රය කරද්දි නොගැළපෙන හිත් හොඳට ගැළපෙනවා..."**

සෙනුකා එය කීවේ ටිකක් සෙමිනි. තේනුකට ඒ කතාව වෙනස් කරන්නට ඕනෑ වුණේය. ඔහුගේ කට කීපවරක්ම අංජනා ගැන කියන්නට හැදුවත් ඔහුම හිත පාලනය කරගත්තේය.

**"ඔයා ටොෂී බලන්න ගියෙ නැද්ද?"**

ඇගෙන් අහන්නම බලා සිටි ප්‍රශ්නයක් තේනුකගේ හිතේ තිබුණි. වාහනයක් නළා හඬ නංවාගෙන ගේට්ටුව ළඟින් ඉගිලුනි.

**"ඒක කියන්නත් එක්ක තමයි මං ඔයාව තනියම අල්ලගන්න ආවේ. පව් මල්ලි එයා... කවද ඇවිදින්න පුළුවන් වෙයිද දන්නෙ නෑ..."**

සෙනුකාගේ හඬේ සැබෑම ශෝකයක් විය.

ලෙඩ ඇඳක වැතිර හිඳින ටොෂිකෝගේ අසරණ වී ගිය මුහුණ තේනුක තෙන්නකෝන්ගේ ඇස් ඉස්සරහ මැවුණේය.

**"එයාගෙ ලෙඩේට වඩා ඔයා ගැන විස්තර ඇහුවේ... ටොෂී තමයි මට මුලින්ම කිව්වෙ ඔයාට ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවා, ඒ අංජනා කියලා..."**

සෙනුකාගේ සුදු දත් ලයිට් එළියට දිලිසුණේය.

**"තාම හොස්පිටිල් නේද? පව් ඉතින්... අපිට කරන්න දෙයක් තියෙනවා නම් ඉතින් කරලා දෙන්න හරි පුළුවන්..."**

තේනුක තෙන්නකෝන්ගේ කතා ස්වරය සෙනුකාට දැනුණේය. ටොෂිකෝ හා තේනුක අතරේ ප්‍රේම සම්බන්ධයක් නොතිබුණත් ඔවුන් දෙදෙනා අතරේ නමක් දිය නොහැකි අන්දමේ බැඳීමක් තිබූ වග සෙනුකා දන්නීය. ඇත්තටම සෙනුකා සිතුවේ කවදු හෝ විවාහයට තරුණියක් තෝරා ගන්නා අවස්ථාවේ හෝ සොහොයුරා ටොෂිකෝ ගැන සිතාවි කියාය. ඒත් එය එසේ වූයේ නැත.

> **ඇයි ඔයා සද්ද නැත්තේ..? ඇයි ඔයා අංජනා ගැන මගෙන් දැන් අහන්නෙ නැත්තේ..?**

**"ටොෂීගේ බලාපොරොත්තුවක් තියෙනවා ටිකක් හොඳ වෙද්දී ලංකාවට ඇවිත් අපේ සිංහල වෙදකම් කරගන්න..."**

**"කොච්චර කල්යයිද ඒ තත්ත්වෙට නැගිටින්න..?"**

**"ටික දවසකින් පුළුවන් කිව්වා. වෙදකමත් එක්ක හිතේ විශ්වාසෙ තියෙනවනම් තව ඉක්මන්..."**

**"මට ටොෂීව බලන්න යන්න තියෙනවා නම් හොඳයි... ඒ කාලේ එයා මට ගොඩක්** උදව් කරලා තියෙනවා අක්කා ඒ රටේ ජීවත්වෙන්න..."

"ඉතින් මං ගියාම එන්න... මං ටිකට් එක දාන්නම්. චතුමිණීටත් එන්න ඕනි කිව්වා. දෙන්නම එන්න එහෙනම්..."

**"අක්කා... ඇයි ඔයාවත් මාව තේරුම්ගන්නෙ නැත්තේ..? ඔයා නේද අම්මා ගාවට මාව තේරුම්ගත්ත එකම කෙනා. දැන් අම්මත් වෙනස්වෙලා. ඔයත් මේ ආව දවස් දෙක තුනට ඔක්කොම අමතකයි වගේ කතා කරන්නේ..."**

තේනුක කීවේ සෙනුකා තෙන්නකෝන්ගේ අත දැඩි ලෙස අල්ලා ගනිමිනි. ඔහුගේ සිතුවිලිවල ආවේගය ඒ බැල්මේ ඇතැයි සෙනුකාට හැඟුණත් ඇය කිසිවක් කියන්නට ගියේ නැත.

**"අම්මත් කැමති ඇති එයාගෙ මල්ලිගෙ දුව මං කසාද බඳිනවා නම්. මේ හැමෝටම තියෙන්නේ දේපළ තන්හාවක්. මට ඔය කිසි දේක ආසාවක් නෑ. හැබැයි හිතේ සතුට වටිනවා. මං චතුමිණීට අකමැතියි කියලා දැන දැන අම්මා එයාව මෙතෙන්ටත් එක්ක ඇවිත්."**

සොහොයුරාගේ හඬේ එවර ඇත්තේ අමනාපයකි. මේ නිවස තේනුකට මිලදීගන්නට සල්ලි දුන්නේ සෙනෙහෙලතා මැණිකේ බව මේනකගෙන් සහ තෙන්නකෝන් ඇමතිගෙන් තවදුරටත් වසං කරගෙන සිටියද ඒ බව සෙනුකාට කීවේ ලංකාවට පැමිණ දෙවැනි දිනයේය. නිශ්ශංක රාජපක්ෂ තේනුකට චතුමිණී යෝජනා කළ විට දුරදිග නොසිතා ඊට කැමැත්ත දුන්නද තේනුක ඊට අකමැති බවක් පෙන්වීමත් සමඟ සහෝදරයාත් අමනාප වී ඇති බව කියමිනි.

ලංකාවට පැමිණි ද පටන් තේනුක නැවතී සිටි තෙන්නකෝන් බණ්ඩාරගේ නිවස මේනක බලෙන් සේ අත්පත් කරගත්තාට පසු නුවර ඉඩම නිශ්ශංක රාජපක්ෂට විකුණා මේ ගෙය අරන් දුන් බව සෙනෙහෙලතා මැණිකේ සෙනුකාට කීවේ හිතේ බර අඩුකරගන්නය. ඇත්තටම ඇය චතුමිණී මෙහි කැඳවා එන්නට අකමැතිවෙද්දී දුරදිග නොසිතා ඇයවද මේ ගමනට සම්බන්ධ කරගත්තේ සෙනුකාය. ඇයට ඒ සියල්ල මතක් වෙද්දී වැරදිකාර හැඟීමකින් හිත පෙළෙන්නට විය.

**"ඇයි ඔයා සද්ද නැත්තේ..? ඇයි ඔයා අංජනා ගැන මගෙන් දැන් අහන්නෙ නැත්තේ..? හැමෝගෙම හිත කැමති කෙනෙක් කාලාන්තරයක් තිස්සේ හිත අස්සෙ ජීවත්වෙනවා. මටත් හිටියා එහෙම කෙනෙක්. එයාව මට ජපානෙදිවත් හම්බවුණේ නෑ. හැබැයි මගේ ෆෝන් ෂොප් එකට එයා මාව හොයාගෙන ආවා. ඉරණම කියන්නෙ අන්න ඒක අක්කා. අපි හැමෝම වෙනුවෙන් කෙනෙක් මේ ලෝකෙ වෙන්වෙලා ඉන්නවා. චතුමිණීගෙ කෙනත් ඇති කොහේහරි. එයාව හොයාගන්න කියන්න. ඔයා හරි මේ අවුල ලිහලා යන්න අක්කා..."**

තේනුකගේ හඬේ වූයේ බැගෑපත් ඉල්ලීමකි. කටහඬක් ඇසුනෙන් ඔවුන් දෙදෙනාම පිටුපස බැලූහ. සෙනෙහෙලතා මැණිකේත් චතුමිණීත් ඔවුන් සිටි දෙසට එමින් උන්හ.

**"අපි ඔය ගැන පස්සෙ කතා කරමු."**

**"මට මගේ ප්‍රශ්නයක් කතා කතාකරන්නවත් මගේ කියලා කෙනෙක් මේ රටේ නෑ අක්කා..."**

තේනුක තෙන්නකෝන් ඉඳගෙන සිටි තැනින් නැගිට්ටේ හිතාමතාය. නොඑසේ නම් ඊළඟ මොහොතේ එතැනට එන චතුමිණීද ඔය ඉඩෙහි ඉඳගන්නවා ඇත.

**"රෑ වුණා... අපි යන්න ඕන ලොකු දුව..."**

සෙනෙහෙලතා මැණිකේ සෙනුකා තෙන්නකෝන්ට මතක් කළේ බිම්මහලේ වැරැන්ඩා කොටසේ ඇති විසල් කුළුනකට හේත්තු වෙමිනි. තේනුක අනුමාන කළා සේම චතුමිණී විත් සෙනුකා ළඟින් ඉඳගත්තේ ඇගේ කරට උඩින් අතක්ද දමා ගනිමිනි.

**"ඉතින් අපි අද මෙහෙ ඉම්මුකෝ."**

චතුමිණීගේ යෝජනාවට තේනුක සේම සෙනුකාත් අකමැති වුණේය. ඔහුගේ නිදහසට බාධා කරන්නට ඇගේ හිත අකමැති වුණේය.

**"මෙහෙ ඉඳලා මල්ලිට වදදෙන්න ඕනි නෑ අරහෙ ගෙදරක් තියෙද්දී. මල්ලිට පුළුවන් නේද අපිව බස්සලා එන්න..?"**

චතුමිණීගේ කතාවට පුංචි විරෝධයක් ද පාමින් සෙනුකා අසද්දී ආයෙත් තේනුක තෙන්නකෝන් අවුල් වුණේය. ඒ ඔවුන් කාරයට නංවාගන්නේ කෙසේද කියාය. අංජනාගේ හෑන්ඩ් බෑගයේ සිට ඇගේ ගමන් බෑගය ඇතුළු බොහෝ දෑ ඇත්තේ ඩිකියේ නොව කාරයේ පසුපස අසුනේය.

**"නැන්දම්මේ එයා කල්පනා කරන්නේ අපිව එක්ක යන්න අකමැත්තේ වගේ. මං මේනක අයියට එන්න කියන්නද?"**

තේනුක කේන්තිය පුරවාගත් ඇස්වලින් චතුමිණී දෙස බැලුවේය. ඒ තවත් ප්‍රශ්නයක මුල බව ඔහුගේ හිත කිව්වේය.

ලබන සතියට

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහළ මිලක්
076 101 88 53
SL PROMO

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# විස්සෝප වෙලා පලක් නැති එකේ විස්කෝතුවක්වත් හදලා විකුණමු





**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

අවදානමක් ගන්න බය මිනිස්සුන්ට අවධානයක් ගන්න කොහොමටත් බැහැයි කියලා කතාවක් තියෙනවා. ආන්න ඒ කියමන සත්‍ය බව පසක් කරපු උත්තමයෙක්ගෙන් අද කතාව පටන්ගමු.

දකුණු පළාතේ ජීවත්වෙච්චි අඟුළුගහ ගමගේ හින්නිඅප්පුහාමි කොළඹට ආවේ රස්සාවක් හොයාගන්න. ඒ එද්දි හින්නිඅප්පුහාමිගේ අතේ වැඩි මුදලක් තිබිලත් නැහැ. හැබැයි ඒ කෝක වෙතත් අවදානමක් අරන් කොළඹට එන්න උන්දෑ බය වෙලත් නැහැ.

හින්නිඅප්පුහාමිගේ කැපවීම මහන්සිය නිසාම ටික දෙහක් යද්දි පිටකොටුවේ හරස් වීදිය පාරේ පුංචි තේ කඩයක් දාගන්න උන්දැට පුළුවන් වෙලා. තේ කඩේකින් සෑහීමට පත්වෙලා මනුස්සයා වැඩේ අතෑරලා නැහැ. තව තවත් මහන්සියෙන් වැඩ කරලා. ඒ මහන්සියේ ප්‍රතිඵලේ විදියට 1935දී හින්නිඅප්පුහාමි කොටුවේ මැලිබන් වීදියේ හෝටලයක් ඇරලා. හෝටලේ විකුණලා තියෙන්නේ හින්නිඅප්පුහාමිගේ අතින්ම හදපු බිස්කට්, පාන්, බනිස්, රසකැවිලි. මේ නිෂ්පාදනවලට ඇතිවෙන ඉල්ලුම එක්ක 1954දී හින්නිඅප්පුහාමි මැලිබන් කියලා බිස්කට් කර්මාන්තශාලාවක් ආරම්භ කළා. ඒක ලංකාවේ පළවැනි බිස්කට් කොම්පැණිය. පස්සේ හින්නිඅප්පුහාමිව හැඳින්නෙව්වේ 'මැලිබන් මුදලාලි' කියලා. මැලිබන් ව්‍යාපාරය අද වෙනකොට රටවල් 35කට බිස්කට් අපනයන කරන මහවිශාල ව්‍යාපාරයක්.

උත්සාහය තියෙනවා නම් විස්කෝතුවක් හදලා වුණත් මනුස්සයෙක්ට ගොඩයන්න පුළුවන් කියන එකට මේ කතාව හොඳ උදාහරණයක්. ඒ නිසා ස්වයං රැකියාවක් විදියට බිස්කට් වර්ග දෙකක්ම හදාගන්න හැටි කියලා දෙන්න අපි කල්පනා කළා.

මුලින්ම බිස්කට් හදලා තියෙන්නේ සුමේරියානුවෝ. එච්චා හදලා තියෙන්නේ බාර්ලිවලින්. බාර්ලිවලින් හදපු මේ බිස්කට් මුලින්ම අරගෙන තියෙන්නේ කෑමට නෙමේ බීර පදම් කරන්න.

මධ්‍යකාලීන යුගයේදී රෝමන්වරු මේ ජාතියටම සීනි එකතු කරලා කෑමට ගත්තලු. ඉතින් සමහරු බිස්කට් සොයාගැනීමේ ගෞරවය දෙන්නේ රෝමන්වරුන්ට. පස්සේ බිස්කට් රෙසපිය එංගලන්තෙට ගියාම ඒ අය එච්චා කාලා තියෙන්නේ වයින්වල පොඟවලා. අවමංගල කටයුතුවලදි මළසිරුරේ අත උඩින් බිස්කට් එකක් තියලා භූමිදානය කරාපුවහම මළ උන්දගේ පව් නැතිවෙනවය කියලලු ඒ අය විශ්වාස කරලා තියෙන්නේ.

බිස්කට් ගැන ඔය කතා කොහොම වෙතත් ඉස්සර ඉඳලා අපේ රටේ ගෙවල්වල හවසට බිස්කට් එකක් වරදින්නේ නැහැ. ගෙදර ඉන්න පුංචි එකාගේ ඉඳලා වයසක උදවිය දක්වා කට්ටිය විස්කෝතුවලට මනාපයි නොවෑ. හැබැයි දැන් ටික දවසක ඉඳලා ඒ කියන්නේ උද්ධමනය එක්ක බිස්කට්වල මිල එහෙමත් ඉහළ ගියානේ. ඒ නිසා ගොඩක් උදවිය දැන් බිස්කට් කනවා අඩුයි කියලයි කසුකුසුව. හැබැයි අපි කියලා දෙන්නේ අඩු මුදලකින් හදාගන්න පුළුවන් බිස්කට් වර්ග දෙකක්. ඉතින් ස්වයං රැකියාවක් විදියට ප්‍රමිතියට හදලා සාධාරණ මුදලට දෙන්න හැකිනම් හොඳ ඉල්ලුමක් හදාගන්න එක අමාරු නැහැ කියලා නම් සහතිකයි.

## වයින් බිස්කට්



මුලින්ම අපි හදමු වයින් බිස්කට්. ඒකට මේ බඩු ටික ගන්න.

පිටි 150g , කුඩුකරගත් සීනි 80g, මාගරින් 60g, බේකින් පවුඩර් තේ හැඳි 1, බිත්තර 1, මද රස්නේ වතුර තේ හැඳි 2, වැනිලා එසන්ස් තේ හැඳි 1

### පියවර 1



පිටියි, බේකින් පවුඩරුයි එකට එකතු කරලා තුන්පාරක් හලාගන්න. සීනි සහ මාගරින් විස්ක් එකකින් නැත්නම් බීටරයකින් හොඳට මිශ්‍ර කරන්න. පස්සේ බිත්තරයක් දාලා බීට් කරන්න.

### පියවර 2



මිශ්‍රණයට දැන් පිටි ස්වල්පය බැගින් එකතු කරන ගමන් හොඳට කලවම් කරන්න. වැනිලා එකතු කරන්න. මේ මිශ්‍රණය තරමක් දියාරු වෙන්න ඕනේ නිසා වතුර තේ හැඳි දෙක එකතු කරන්න. හැන්ද ඉස්සුවට පස්සේ කන්දක් වගේ වැක්කෙරෙන ගාණට තමා මිශ්‍රණේ පදම.

මේ මිශ්‍රණය පයිපින් බෑග් එකකට දාලා තෙල් කඩදසි දාපු තැටියකට පරතරය හිටින විදියට පයිපින් කරන්න. 170C ක ප්‍රීහීට් කළ අවන් එකක විනාඩි 10ක් විතර බේක් කරලා නිවුණාට පස්සේ ඇසුරුම් කරන්න.

(අවන් එකක් නැත්නම් අඩිය ගනකම් භාජනයකට ලුණු කුඩු දාලා හොඳට වැහෙන පියනකින් වහලා විනාඩි 10ක් රත් කරන්න. පස්සේ ඇතුළින් දරණුවක් තියලා පයිප් කරගත්තු මිශ්‍රණය තියලා විනාඩි 10ක් බේක් කරගන්න.)



## ඇඟිලි විස්කෝතු

බිත්තර 2, සීනි 30g, අයිසින් සීනි 30g, පිටි 50g, වැනිලා තේ හැඳි 1/2, නැත්නම් ඉඟුරු ඉස්ම, ලුණු පදමට

### පියවර 1

බිත්තර සුදුමද, කහමද වෙන් කරගන්න. සුදුමද බීට් කරන්න. ඒකට අයිසින් සීනිත් දාලා ආයෙත් බීට් කරන්න. කන්දක් වගේ නොවැටෙන පදමට.

### පියවර 2

කහමද ටික බීට් කරන්න. ඒකට සීනි එකතු කරලා ක්‍රීම් වෙනකල් බීට් කරන්න. කලින් හදාගත්තු සුදුමද ටිකට මේකත් එකතු කරන්න. මේකට පිටි, වැනිලා එහෙමත් එකතු කරලා පයිපින් බෑග් එකකට දාලා, අඟල් 4, 6ක් විතර දිගට තරමක් ගනකම් වෙන්න පයිපින් කරගන්න. උඩින් අයිසින් සීනි ටිකක් ඩස්ට් කරලා 180C ක විනාඩි 12-15 බේක් කරන්න. පස්සේ අවන් එක ඕෆ් කරලා ඒක ඇතුළෙම නිවෙන්න අරින්න.



මේ බිස්කට් හුළං නොවදින විදියට අසුරා ගන්න. මේ විස්කෝතු බර අනුව රුපියල් 100 ඉඳලා මිල කරන්න පුළුවන්. 0714766819 අංකයට කතා කරලා තවත් විස්තර අහගන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.